# ශ්‍රී ලංකා ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 245/11 — 1976 දෙසැම්බර් 31 වැනි සිකුරාද — 1976.12.31

(ආණ්ඩුවේ බලය පිට ප්‍රසිද්ධ කරන ලදි.)


# I වැනි කොටස: (I) වැනි ඡේදය—සාමාන්‍ය

## "සුරාබදු ආඥ පනත" පිළිබඳ දැන්වීම්

සුරාබදු ආඥපනත

අංක 631 දරණ සුරාබදු නිවේදනය

1977 ජනවාරි 1 වනදා සිට ක්‍රියාත්මක වන පරිදි,

(1) (අ) (පිටත ගෙන ගොස් පරිභෝජනය කිරීම සඳහා) රටබීම සිල්ලරට විකිණීමේ බලපත්‍රලත් ස්ථානවල ඒ ස්ථානවලදී පරිභෝජනය පිණිස නොව බෝතල ගණනේ පමණක්,

(ආ) (සිල්ලරට විකිණීමේ බලපත්‍රලත් ස්ථාන හැර) රටබීම විකිණීම සඳහා බලපත්‍රලත් ස්ථාන වලද,

(ඇ) ඒ ස්ථානවලදීම පරිභෝජනය කිරීම පිණිස (මෙරට නිෂ්පාදිත ධාන්‍ය මත්පැන් ද ඇතුළුව) රටබීම විකිණීම සඳහා බලපත්‍රලත් රටබීම තැබෑරුම් වලද,

(ඈ) (මෙරට නිෂ්පාදිත ධාන්‍ය මත්පැන් ද ඇතුළුව) රටබීම විකිණීම සඳහා බලපත්‍රලත් තානායම් වල සහ,

(ඉ) (මෙරට නිෂ්පාදිත ධාන්‍ය මත්පැන් ද ඇතුළුව) රටබීම විකිණීම සඳහා විශේෂයෙන් බලපත්‍රලත් ස්ථානවල

අරක්කු විකිණීම සඳහා දෙනු ලබන සියළුම බලපත්‍ර—

(i) මෙහි I වන උපලේඛනයේ දක්වා ඇති ප්‍රමාණ අනුව ගණන් බලා කරන ලද උචිත ගාස්තු ගෙවීමෙන්,

(ii) එක් වර්ෂයකට වඩා වැඩි නොවූ කාල පරිච්ඡේදයක් සඳහා,

(iii) මෙහි II වන උපලේඛනයේ දක්වා ඇති උචිත ආකෘති පත්‍රවල, සහ

(iv) එකී ආකෘති පත්‍රවල ඇතුළත් සීමා කිරීම් වලට යටත්ව සහ ඒවායේ ඇතුළත් කොන්දේසි මත, නිකුත් කළ යුතු බව

සහ

(2) 1955 සැප්තැම්බර් මස 16 වන දින හා අංක 10,839 දරන ගැසට් පත්‍රයේ පළ කරන ලද අංක 451 දරන සුරාබදු නිවේදනය, 1965 ඔක්තෝබර් 22 වන දින හා අංක 14,539 දරන ගැසටපත්‍රයේ පළ කරන ලද අංක 512 දරන සුරාබදු නිවේදනය, 1967 සැප්තැම්බර් 01 වන දින හා අංක 14,764 දරන ගැසට් පත්‍රයේ පළ කරන ලද අංක557 දරන සුරාබදු නිවේදනය, 1968 පෙබරවාරි මස 02වන දින හා අංක 14,787 දරන ගැසට් පත්‍රයේ පළ කරන ලද අංක 562 දරන සුරාබදු නිවේදනය, 1973 පෙබරවාරි මස 23 වන දින හා අංක 48 දරන ගැසට් පත්‍රයේ පළ කරන ලද අංක 603 දරන සුරාබදු නිවේදනය, 1974 සැප්තැම්බර් මස 20 වන දින හා අංක 130 දරන ගැසට් පත්‍රයේ පළ කරන ලද අංක 611 දරන සුරාබදු නිවේදනය සහ 1974 නොවැම්බර් මස 28 වන දින හා අංක 140 දරන ගැසට් පත්‍රයේ පළ කරන ලද අංක 612 දරන සුරාබදු නිවේදනය යන නිවේදන වලින් සංශෝධිත 1954 ජූලි මස 2 වන දින හා අංක 10, 689 දරන ගැසට් පත්‍රයේ පළ කරන ලද අංක 439 දරන සුරාබදු නිවේදනය

පරිච්ඡින්න වන බව,

මුදල් අමාත්‍යවරයා විසින් (52 වන අධිකාරය වන) සුරාබදු ආඥපනතේ 25 වන වගන්තිය යටතේ නියම කරන ලදී.

සී. සිවප්‍රගාසම්,
අතිරේක ලේකම්,
මුදල් අමාත්‍යාංශය.

1976 දෙසැම්බර් මස 31 වන දින,
කොළඹ දිය.

### I වන උපලේඛනය

| බලපත්‍රයේ ස්වභාවය | ගාස්තුව |
|---|---|
| (1) (පිටත ගෙනගොස් පරිභෝජනය කිරීම සඳහා) රටබීම සිල්ලරට විකිණීම සඳහා බලපත්‍රලත් ස්ථානවල (ඒ ස්ථානවලදී පරිභෝජනය පිණිස නොව) බෝතල ගණනේ පමණක් අරක්කු විකිණීම සඳහා දෙනු ලබන බලපත්‍රය. ... ... ... ... | ඉහතින් වූ වර්ෂයේ අගෝස්තු මස 31 වන දිනෙන් අවසන් වුනු අනුගාමී මාස දොළහේ කාලය තුළ එම ස්ථානයෙහි අරක්කු අලෙවිය පදනම් කොට ගෙන ගණන් බලා ඇස්තමේන්තු කරන ලද, එකී ස්ථානයේ බලපත්‍රයේ කාලසීමාවේ අරක්කු අලෙවියේ රුපියල් 200ක උපරිමයකට යටත්ව එක් ගැලුමකට ශත පනහ බැගින්, |
| (2) (පිටත ගෙනගොස් පරිභෝජනය කිරීම සඳහා) සිල්ලරට විකිණීමේ බලපත්‍රලත් ස්ථාන හැර, රටබීම විකිණීම සඳහා බලපත්‍ර ලත් ස්ථානවල අරක්කු විකිණීම සඳහා දෙනු ලබන බලපත්‍රය. ... ... | ඉහතින් වූ වර්ෂයේ අගෝස්තු මස 31 වන දිනයෙන් අවසන් වුනු අනුගාමී මාස දොළහේ කාලය තුළ එම ස්ථානයෙහි අරක්කු අලෙවිය පදනම් කොට ගෙන ගණන් බලා ඇස්තමේන්තු කරන ලද, එකී ස්ථානයේ බලපත්‍රයේ කාලසීමාවේ අරක්කු අලෙවියේ. රුපියල් 200ක උපරිමයකට යටත්ව එක් ගැලුමකට රුපියල් එකයි ශත පනහ බැගින්, |

1 ෳ—ජ 24.78— 4,470 (76/12)

| | |
|---|---|
| (3) ඒ ස්ථාන වලදීම පරිභෝජනය කිරීම පිණිස (මෙරට නිෂ්පාදිත ධාන්‍ය මත්පැන් ඇතුළුව) රටබීම විකිණීම සඳහා බලපත්‍ර ලත් රටබීම තැබෑරුම් වල අරක්කු විකිණීම සඳහා දෙනු ලබන බලපත්‍රය. | ගාස්තුවක් නොමැත. |
| (4) (මෙරට නිෂ්පාදිත ධාන්‍ය මත්පැන් ඇතුළුව) රටබීම විකිණීම සඳහා බලපත්‍ර ලත් තානායම්වල අරක්කු විකිණීම සඳහා දෙනු ලබන බලපත්‍රය | ඉහතින් වූ වර්ෂයේ අගෝස්තු මස 31 වන දිනෙන් අවසන් වුනු අනුගාමී මාස 12 හේ කාලය තුළ එම තානායමේ අරක්කු අලෙවිය පදනම් කොට ගෙන ගණන් බලා ඇස්තමේන්තු කරන ලද, එකී ස්ථානයේ බලපත්‍රයේ කාලසීමාවේ අරක්කු අලෙවියේ, රුපියල් පහක උපරිමයකට යටත්ව එක් ගැලුමකට රුපියල් එක බැගින්, |
| (5) (මෙරට නිෂ්පාදිත ධාන්‍ය මත්පැන් ඇතුළුව) රටබීම විකිණීම සඳහා විශේෂයෙන් බලපත්‍රලත් ස්ථානවල අරක්කු විකිණීම සඳහා දෙනු ලබන බලපත්‍රය. ... ... ... ... | ඉහතින් වූ වර්ෂයේ අගෝස්තු මස 31 වන දිනෙන් අවසන් වුනු අනුගාමී මාස දොළහේ කාලය තුළ එම ස්ථානයෙහි අරක්කු අලෙවිය පදනම්කොට ගෙන ගණන් බලා ඇස්තමේන්තු කරන ලද, එකී ස්ථානයේ බලපත්‍රයේ කාලසීමාවේ අරක්කු අලෙවියේ රුපියල් 5ක උපරිමයකට යටත්ව එක් ගැලුමකට රුපියල් එක බැගින්. |

## II වන උපලේඛනය

ගාස්තුව රු : ............

(පිටත ගෙනගොස් පරිභෝජනය කිරීම සඳහා සිල්ලරට විකිණීමේ බලපත්‍ර ලත් ස්ථාන හැර) රටබීම විකිණීම සඳහා බලපත්‍රලත් ස්ථානවල හෝ (මෙරට නිෂ්පාදිත ධාන්‍ය මත්පැන් ද ඇතුළුව) රටබීම විකිණීම සඳහා බලපත්‍රලත් රටබීම තැබෑරුම් වල හෝ, බලපත්‍රලත් ස්ථානයේදීම පරිභෝජනය සඳහා පමණක් අරක්කු විකිණීමේ බලපත්‍රය

බලපත්‍රධාරියාගේ නම : ............

බලපත්‍රලත් ස්ථානයේ විස්තර : ............

නිකුත් කළ දිනය : ............

අවසන් වන දිනය : ............

රු 1/-ක මුද්දර

————————,
සුරාබදු කොමසාරිස්.

19...... ක්වූ ...... මස ...... වන දින,
කොළඹ, සුරාබදු කොමසාරිස් කාර්යාලයේ දීය

### අනුපූරණ ගිවිසුම

තත් කාලයේ වලංගු සියලු සුරාබදු බලපත්‍රවලට අදාල පොදු කොන්දේසි මාලාවටද, මේ බලපත්‍රයට අදාල පහත සඳහන් විශේෂ කොන්දේසි වලටද යටත්ව, 19...... ක්වූ දෙසැම්බර් මස 31 වන දිනයෙන් අවසන් වන කාර්යාලීය වර්ෂය තුළ මෙහි පහත වඩාත් සම්පූර්ණ වශයෙන් විස්තර කර ඇති ස්ථානයෙහි අරක්කු විකිණීමට ඉහත නම් සඳහන් බලධාරියා/ධාරීන් වන මම/අපි බලපත්‍රයෙහි (මේ වනාහි එහි අනුපිටපතකි ) ඇතුළත් නියම හා කොන්දේසි හොඳිනුත් අවංක ලෙසත් පිළිපදින බවට ද ඉෂ්ට කරන බවට ද එකී බලධාරියා/ධාරීන් වන ................. නමැති මම/අපි සුරාබදු කොමසාරිස්ට මෙයින් පොරොන්දු වෙමි/වෙමු.

1. ................. දිස්ත්‍රික්කයේ ............ හි පිහිටි අංක ...... දරන තැබෑරුමෙන් පමණක්, එකී තැබෑරුමෙහි (මෙහි මින් මතු " රේන්දකරු " යනුවෙන් හඳුන්වනු ලබන) රේන්දකරුට මහජනයා වෙත අරක්කු විකිණීමට නීතියෙන් බලය ලැබී ඇති මිලට බලධාරියා/බලපත්‍රධාරීන් විසින් අරක්කු ලබාගත යුතුය.

2. (අ) සුරාබදු අධිකාරී විසින් නිකුත් කරනු ලබන අවසර පත්‍රයක අධිකාරය යටතේ මිස, එකී තැබෑරුමේ සිට බලපත්‍රලත් ස්ථානයට අරක්කු කිසිවක් නොයැවිය යුතුය. එය නිකුත් කරනු ලබන දිනයේ පස්වරු 6ට පසු යම් වේලාවක කිසිම අවසර පත්‍රයක් පාවිච්චි කිරීමට ඉඩදෙනු නොලැබේ.

(ආ) එවැනි සියලුම අවසරපත්‍ර බලපත්‍රලත් ස්ථානයේ ලිපිගොනුවක යොදා ඒ ඒ අවසරපත්‍රය නිකුත් කරනු ලැබූ දිනයේ පටන් දොළොස් මාසයක් ගතවන තුරු පරීක්ෂාව සඳහා ඉදිරිපත් කළ හැකි වන අයුරු තබා ගතයුතුය.

3. ඩ්‍රෑම් ගණනේ හෝ බෝතල ගණනේ හෝ එම අරක්කු විකිණීම, ඒ සඳහා බලපත්‍රලත් ස්ථානයේදී පරිභෝජනය සඳහා පමණක් වියයුතු අතර ඒ අරක්කු විකිණීම බලධාරියා/බලපත්‍රධාරීන් දරණ රටබීම බලපත්‍රයෙන් රටබීම විකිණීමට අවසර දී ඇති වේලාවල්, මිළට ගන්නවුන්ගේ පංක්තිය සහ ව්‍යාපාර යේ ස්වභාවය යන මේ කරුණු සම්බන්ධයෙන් පනවා ඇති සීමාවන්ට යටත් විය යුතුය.

4. විවෘත නොකරන ලද බෝතල් වල අරක්කු විකිණීම.—(අ) බලපත්‍රධාරියා/ධාරීන් ළඟ විකිණීම පිණිස තිබෙන්නාවූ ඕනෑම වර්ගයක සීල් අරක්කු බෝතලයක් යම් ගැණුම්කරුවකු ඉල්ලා සිටින්නේ නම් එම බලපත්‍රධාරියා/ධාරීන් එකී ගැණුම්කරුවාට ඉල්ලා සිටින ලද වර්ගයේ බෝතල්ගත අරක්කු පමණක් විකිණිය යුතු අතර එකී අරක්කු බෝතල මත ඒවායේ නිෂ්පාදනයන් විසින් තබන ලද මූඩි හෝ මුද්‍රා හෝ නොකඩා තිබිය යුතුය.

(ආ) බලපත්‍රධාරියා/ධාරීන් හෝ ඔහුගේ/ඔවුන්ගේ නියෝජිතයා එසේ විකුණන ලද අරක්කු බෝතලයක් මත නිෂ්පාදකයා විසින් තබන ලද මුද්‍රාව ගැනුම්කරුවාගේ ඉල්ලීම පිට මිස කඩා විවෘත නොකළ යුතුය. ඒ ද නොකැඩූ මුද්‍රාවක් සහිතව ගැනුම්කරුවා අතට බෝතලය දුන්නාට පසුව ඔහු එසේ ඉල්ලා සිටියහොත් පමණි.

(5) සීල් බෝතල්වල තිබෙන අරක්කු ප්‍රමාණයන්ට අඩු අරක්කු ප්‍රමාණයන් වීදුරුවට දමා විකිණීම.—(අ) ගැනුම්කරුවෙකු යම් අරක්කු වර්ගයක, බලපත්‍රධාරියා/ධාරීන් ළඟ විකිණීම සඳහා තිබෙන්නාවූ එම අරක්කු වර්ගයේ කුඩාම මුද්‍රා තැබූ බෝතලයේ ඇතුළත් අරක්කු ප්‍රමාණයට අඩු, අරක්කු ප්‍රමාණයක් ඉල්ලා සිටිනුයේ නම්, මෙම කොන්දේසියේ විධි විධාන යටතේ, එවිටමත් විවෘත කර ඇති බෝතලයක් නැත්නම් සීල් අරක්කු බෝතලයක මුද්‍රාව හෝ මූඩිය ඇරීමට ද එයින් අරක්කු වීදුරුවලට දමා බොන්නට දීමට ද ඔහුට/ඔවුන්ට හිමිකම් ඇත්තේය.

(ආ) බලපත්‍රධාරියා/ධාරීන් කිසිම අවස්ථාවකදී බලපත්‍රලත් ස්ථානයේ ඔහුගේ/ඔවුන්ගේ ළඟ, අරක්කු වීදුරුවලට දමා බොන්නට දීම සඳහා කිසිම අරක්කු වර්ගයකින් සම්මත කාර්තුවේ අරක්කු බෝතල දෙකකට වඩා විවෘත කර තබා නොගත යුතුය. බලපත්‍රධාරියා/ධාරීන් වීදුරු ගණනේ අරක්කු විකිණීම සඳහා සම්මත කාර්තු එකකට අඩු ධාරිතාවක අරක්කු බෝතල විවෘත නොකළ යුතුය.

(ඇ) වීදුරුවලට දමා අරක්කු විකිණීම කළ යුත්තේ ඩ්‍රෑම් භාග ගණනේ සහ එහි ගුණිතයන් වශයෙනි.

(6) සුරාබදු අධිකාරි විසින් අනුමත කරන ලද ඩ්‍රෑම් එක සහ ඩ්‍රෑම් භාගය යන මේ සම්මත මිනුම් තබා ගතයුතුය. අරක්කු මිලට ගන්නා කෙනකු තමා මිලට ගන්නා අරක්කු ප්‍රමාණය යථෝක්ත සම්මත මිනුමකින් මැන දෙන ලෙස ඉල්ලා සිටියහොත්, එකී මිනුම් භාවිත කළ යුතුය.

(7) මෙම බලපත්‍රය යටතේ විකුණනු ලබන්නාවූ හෝ විකිණීම පිණිස තබා ඇත්තාවූ සියලුම අරක්කු, 1928 ජූලි මස 13 වන දින අංක 7654 දරණ ගැසට් පත්‍රයේ පළවූ අංක 178 දරණ සුරාබදු නිවේදනයේ විධි විධාන වලට අනුකූලව පරීක්ෂා කර බලන ලදුව, ඒ සඳහා තත් කාලයේ වලංගු අරක්කු රේන්ද විකිණීමේ කොන්දේසි මාලාව යටතේ වූ නිවේදනය මගින් සුරාබදු කොමසාරිස් විසින් නියම කරනලද සැර ප්‍රමාණයට අඩු හෝ වැඩි නොවූ සැර ප්‍රමාණයකින් යුක්ත විය යුතුය. ඒ අරක්කු වලට වතුර, යම්කිසි පාටක්, සුවඳක් නැතහොත් රසක් ඇතිකිරීම සඳහා එකතු කරන ද්‍රව්‍යයක් හෝ අන්කිසි ද්‍රව්‍යයක් එකතු කිරීම නොකළ යුතුය.

(8) 1 වන කොන්දේසියේ සඳහන් කරන ලද තැබැරුමේ අරක්කු තොග නොමැති අවස්ථා වලදී හෝ සුරාබදු කොමසාරිස් විසින් බලපත්‍රධාරියා/ධාරීන් වෙත තබාගතයුතු බවට විශේෂ මාසික සලාකයක් නියම කොට ඇති අවස්ථාවලදී හැර අන් සැම විටකදීම බලපත්‍රධාරියා/ධාරීන් විසින් බෝතල්ගත අරක්කු ගැලුම් දෙකකට නොඅඩු ප්‍රමාණයක් තමන් වෙත තබා ගතයුතුය.

(9) කලින් කල සුරාබදු කොමසාරිස් විසින් නියම කර ඇති මිළ ගණන් වලට හැර අන් මිල ගණනකට අරක්කු ඩ්‍රැම් වශයෙන් හෝ බෝතල වශයෙන් හෝ විකිණීම නොකළ යුතුය. මෙම බලපත්‍රය යටතේ විකුණනු ලබන අරක්කු සම්බන්ධයෙන් බලපත්‍රධාරියා/ධාරීන් විසින් කිසියම් සේවා ගාස්තුවක් හෝ වෙනත් කිසිම අන්දමක අතිරේක ගාස්තුවක් අයකිරීම නොකළ යුතුය.

(10) ඩ්‍රැම් වශයෙන් සහ බෝතල් වශයෙන් විකිණීම සඳහා තබා ඇති අරක්කු විකුණන මිල ඉලක්කමෙන් ද සිංහල, දෙමළ හා ඉංග්‍රීසි අකුරින් ද පැහැදිලි ලෙස දැක්වෙන පත්‍රිකාවක්, අරක්කු මිළට ගැනීමට පැමිණෙන සැම දෙනාටම පහසුවෙන් කියවීමට හැකි වන පරිදි බලපත්‍රලත් ස්ථානයෙහි ප්‍රකටව පෙනෙන ස්ථානයක සවිකර තැබිය යුතුය.

(11) (අ) බලපත්‍රධාරියා/ධාරීන් විසින් මිළට ගත්තාවූ ද විකුණනු ලබන්නා වූ ද එක් එක් අරක්කු වර්ගය සහ එක් එක් බෝතල වර්ගය සඳහා වෙන වෙනම පිටු වෙන් කරන ලද ලේඛනයක, මෙහි පහත නියම කර ඇති ආකෘති පත්‍රයේ ප්‍රකාරයට ගිණුම් තබාගත යුතුය :—

අරක්කු ලේඛනය (ගැළුම් සහ ඩ්‍රැම් වලින්)

වර්ගය : ............

| (1) මාසය | (2) අවසර පත්‍ර අංකය | (3) අතේ ඉතුරු ප්‍රමාණය | (4) ලැබී ඇත | (5) මුළු ගණන | (6) විකුණා ඇත | (7) ඉතුරු ප්‍රමාණය |
|---|---|---|---|---|---|---|
| දින 1 සිට 31 දක්වා | | | | | | |

12. ඉහත 1 වන කොන්දේසියේ සඳහන් අරක්කු තැබැරුමෙන් ඉවත්වයන රේන්දකරුගෙන් නුවුවමනා ප්‍රමාණයේ විශාල අරක්කු තොගයක් තමන් විසින් මිලට ගනු ලැබීම සිදු නොවනු වස්, මේ බලපත්‍රය අවසන් වන අවුරුද්දේ ඔක්තෝබර් මස 15 වන දින සිට දෙසැම්බර් මස 15 වන දින දක්වා වූ කාල පරිච්ඡේදය තුළ අලෙවි වූ අරක්කු ප්‍රමාණය පදනම්කොට ගෙන දින දහයක සාමාන්‍ය අලෙවි ප්‍රමාණයකට වැඩිවන අරක්කු තොගයක් එම අවුරුද්දේ දෙසැම්බර් මස 31 වන දින වන විට තමාලඟ තබා නොගැනීමට බල පත්‍රධාරියා/ධාරීන් වග බලාගත යුතුය.

13. පරීක්ෂක ශ්‍රෙණියට අඩු නොවන තත්වයක් උසුලන සුරාබදු නිලධාරීන්ට අරක්කු රැස්කර තබාඇති සීල් බෝතල් බැලීමට ද ඒවායේ ඇතුලත්ව ඇති අරක්කු වල සැර ප්‍රමාණය සහ තොග ගණන්මෙන්ම ඒවායේ ගණන් හිලව් පරීක්ෂා කිරීමටද බලපත්‍ර දරණ ස්ථානය අරක්කු විකිණීම සඳහා විවෘත කර තිබෙන සියලුම වේලාවලදී අවකාශ දිය යුතුය.

14. මේ බලපත්‍රය සම්බන්ධයෙන්, ස්වකීය කළමනාකරුවන්, නියෝජිතයන් සහ සේවකයන් විසින් කරනු ලබන සියළුම ක්‍රියා ගැන බලපත්‍රධාරියා/ ධාරීන් වගකිව යුතුය.

15. ලියවිල්ලකින් වූ අනුමැතිය පළමුව සුරාබදු කොමසාරිස්ගෙන් ලබාගෙන මිස මේ බලපත්‍රය අන්සතු කළ නොහැකිය.

16. මෙ බලපත්‍රය ඉල්ලා එවූ අයදුම්පත සමඟ බලපත්‍රධාරියා/ධාරීන් විසින් තැන්පත් කරන ලද රුපියල් 1,000ක මුදල මේ බලපත්‍රයේ සාමාන්‍ය සහ විශේෂ කොන්දේසි යථා පරිදි ඉටු කරනු ලබන බවට ඇපයක් වශයෙන් සුරාබදු කොමසාරිස් විසින් තබා ගනු ලබන අතර, මේ කොන්දේසි වලින් යමක් කඩකිරීම සම්බන්ධයෙන් එකී සම්පූර්ණ මුදල හෝ එහි යම් කොටසක්, මේ කොන්දේසි කඩකිරීම සම්බන්ධයෙන් ආඥා පණතේ සලස්වා ඇති දණ්ඩන නියමයන් පැනවීමට අමතරව සුරාබදු කොමසාරිස්ගේ පරම අභිමතය පරිදි රාජසන්තක කරනු ලැබීමටද යටත් වන්නේය.

17. තම අරක්කු තොගය සම්පූර්ණයෙන්ම හෝ කොටසක් තමන් වෙත සපයනු ලැබීමට අපොහොසත් වීම සම්බන්ධයෙන් හෝ රේන්දකරු විසින් කරන ලද යම්කිසි ක්‍රියාවක් හෝ පැහැර හැරීමක් නිසා සිදුවන යම්කිසි පාඩුවක් හෝ අලාභයක් සම්බන්ධයෙන් හෝ වෙනයම් කවර වූ හෝ හේතුවක් සම්බන්ධයෙන් සුරාබදු කොමසාරිස්ගෙන් හෝ ශ්‍රී ලංකා ආණ්ඩුවෙන් කිසිදු හිමිකම් පෑමක් කිරීමට බලධාරියාට/ධාරීන්ට අයිතියක් නොතිබිය යුතුය.

18. කලින් අවලංගු කරනු ලැබුවහොත් මිස මේ බලපත්‍රය ............ වන දින සිට 19...... ක්වූ ...... මස 31 වන දින තෙක් වලංගුව පවත්නේය.

වර්ෂ 19...... ක්වූ ...... මස ...... වන දින,

අත්සන : ............

සාක්ෂි : ............

සුරාබදු ඒ. (ඇෆ්. ඇල්.) 1

ගාස්තුව රු. : ............

(පිටත ගෙනගොස් පරිභෝජනය කිරීම සඳහා සිල්ලර විකිණීමේ බලපත්‍රලත් ස්ථාන හැර) රටබීම විකිණීම සඳහා බලපත්‍රලත් ස්ථානවල හෝ (මෙරට නිෂ්පාදිත ධාන්‍ය මත්පැන්ද ඇතුළුව) රටබීම විකිණීම සඳහා බලපත්‍ර ලත් රටබීම තැබැරුම්වල හෝ බලපත්‍රලත් ස්ථානයේදීම පරිභෝජනය සඳහා පමණක් අරක්කු විකිණීමේ බලපත්‍රය.

තත් කාලයෙහි වලංගු සියළු සුරාබදු බලපත්‍ර වලට අදාල පොදු කොන්දේසි මාලාවට ද මේ බලපත්‍රයට අදාල පහත සඳහන් විශේෂ කොන්දේසි වලටද යටත්ව (මෙහි මින්මතු " බලපත්‍රධාරියා/ධාරීන් " යනුවෙන් හඳුන්වනු ලබන) ................ පදිංචි ...................... ට ........... දිස්ත්‍රික්කයේ ................ විදියේ ................ වන අංකය දරන ස්ථානයේ නැතහොත් ................ හි පිහිටියා වූ ද, (මෙහි මින්මතු, " බලපත්‍ර ලත් ස්ථානය " යනුවෙන් හඳුන්වනු ලබන) ................ යනුවෙන් ව්‍යවහාර කරනු ලබන්නාවූද ස්ථානයෙහි අරක්කු විකිණීමට මෙයින් බලය දෙනු ලැබේ.

1. ...................... දිස්ත්‍රික්කයේ ................ හි පිහිටි අංක ................ දරන තැබැරුමෙන් පමණක්, එකී තැබැරුමෙහි (මෙහි මින්මතු " රේන්දකරු " යනුවෙන් හඳුන්වනු ලබන) රේන්දකරුට මහජනයා වෙත අරක්කු විකිණීමට නීතියෙන් බලය ලැබී ඇති මිලට බලපත්‍රධාරියා/ධාරීන් විසින් අරක්කු ලබාගත යුතුය.

2. (අ) සුරාබදු අධිකාරි විසින් නිකුත් කරනු ලබන අවසර පත්‍රයක අධිකාරය යටතේ මිස, එකී තැබැරුමේ සිට බලපත්‍රලත් ස්ථානයට අරක්කු කිසිවක් නොයැවිය යුතුය. එය නිකුත් කරනු ලබන දිනයේ පස්වරු 6ට පසු යම් වේලාවක කිසිම අවසර පත්‍රයක් පාවිච්චි කිරීමට ඉඩ දෙනු නොලැබේ.

(ආ) එවැනි සියලුම අවසරපත්‍ර බලපත්‍රලත් ස්ථානයේ ලිපිගොනුවක යොදා ඒ ඒ අවසරපත්‍රය නිකුත් කරනු ලැබූ දිනයේ පටන් දොළොස් මාසයක් ගතවනතුරු පරීක්ෂාව සඳහා ඉදිරිපත් කළ හැකි වන අයුරු තබාගත යුතුය.

3. ඩ්‍රැම් ගණනේ හෝ බෝතල ගණනේ හෝ අරක්කු විකිණීම, ඒ සඳහා බලපත්‍රලත් ස්ථානයේදී පරිභෝජනය සඳහා පමණක් වියයුතු අතර අරක්කු විකිණීම බලපත්‍රධාරියා/ධාරීන් දරන රටබීම බලපත්‍රයෙන් රටබීම විකිණීමට අවසර දී ඇති වේලාවල්, මිලට ගන්නවුන්ගේ පංතිය සහ ව්‍යාපාරයේ ස්වභාවය යන මෙ කරුණු සම්බන්ධයෙන් පනවා ඇති සීමාවන්ට යටත් විය යුතුය.

4. විවෘත නොකරන ලද බෝතල්වල අරක්කු විකිණීම.—(අ) බලපත්‍රධාරියා/ධාරීන් ළඟ විකිණීම පිණිස තිබෙන්නාවූ ඕනෑම වර්ගයක සිල් අරක්කු බෝතලයක් යම් ගැනුම්කරුවකු ඉල්ලා සිටින්නේ නම් එම බලපත්‍රධාරියා/ධාරීන් එකී ගැනුම්කරුවාට ඉල්ලා සිටින ලද වර්ගයේ බෝතල්ගත අරක්කු පමණක් විකිණිය යුතු අතර එකී අරක්කු බෝතල මත ඒවායේ නිෂ්පාදනයන් විසින් තබන ලද මූඩි හෝ මුද්‍රා හෝ නොකඩා තිබිය යුතුය.

(ආ) බලපත්‍රධාරියා/ධාරීන් හෝ ඔහුගේ/ඔවුන්ගේ නියෝජිතයා එසේ විකුණන ලද අරක්කු බෝතලයක් මත නිෂ්පාදකයා විසින් තබන ලද මුද්‍රාව ගැනුම්කරුගේ ඉල්ලීම පිට මිස කඩා විවෘත නොකළ යුතුය. ඒ ද නොකැඩූ මුද්‍රාවක් සහිතව ගැණුම්කරුවා අතට බෝතලය දුන්නාට පසුව ඔහු එසේ ඉල්ලා සිටියහොත් පමණි.

5. සිල් බෝතල වල තිබෙන අරක්කු ප්‍රමාණයන්ට අඩු අරක්කු ප්‍රමාණයන් වීදුරුවට දමා විකිණීම.—(අ) ගැණුම් කරුවකු යම් අරක්කු වර්ගයක, බලපත්‍රධාරියා/ධාරින් ළඟ විකිණීම සඳහා තිබෙන්නාවූ එම අරක්කු වර්ගයේ කුඩාම මුද්‍රා තැබූ බෝතලයේ අඩංගු අරක්කු ප්‍රමාණයට අඩු, අරක්කු ප්‍රමාණයක් ඉල්ලා සිටිනුයේ නම්, මෙම කොන්දේසියේ විධිවිධාන යටතේ, එවිටමත් විවෘත කර ඇති බෝතලයක් නැත්නම් සිල් අරක්කු බෝතලයක මුද්‍රාව හෝ මූඩිය ඇරීමට ද එයින් අරක්කු වීදුරු වලට දමා බොන්නට දීමට ද ඔහුට/ඔවුන්ට හිමිකම් ඇත්තේය.

(ආ) බලපත්‍රලාභියා/ලාභීන් කිසිම අවස්ථාවකදී බලපත්‍රලත් ස්ථානයේ ඔහුගේ/ඔවුන්ගේ ළඟ, අරක්කු වීදුරුවලට දමා බොන්නට දීම සඳහා කිසිම අරක්කු වර්ගයකින් සම්මත කාර්තුවේ අරක්කු බෝතල 2 කට වඩා විවෘත කර තබා නොගත යුතුය. බලපත්‍රධාරියා/ධාරින් වීදුරු ගණනේ අරක්කු විකිණීම සඳහා සම්මත කාර්තු එකකට අඩු ධාරිතාවක අරක්කු බෝතල විවෘත නොකළ යුතුය.

(ඇ) වීදුරුවලට දමා අරක්කු විකිණීම කළ යුත්තේ ඩ්‍රෑම් බාග ගණනේ සහ එහි ගුණිතයන් වශයෙනි.

6. සුරාබදු අධිකාරී විසින් අනුමත කරන ලද ඩ්‍රෑම් එක සහ ඩ්‍රෑම් බාගය යන මේ සම්මත මිනුම් තබා ගතයුතුය. අරක්කු මිලට ගන්නා කෙනෙකු තමා මිලට ගන්නා අරක්කු ප්‍රමාණය යථෝක්ත සම්මත මිණුමකින් මැන දෙනලෙස ඉල්ලා සිටියහොත්, එකී මිණුම් භාවිතා කළ යුතුය.

7. මෙම බලපත්‍රය යටතේ විකුණනු ලබන්නාවූ හෝ විකිණීම පිණිස තබා ඇත්තාවූ සියළුම අරක්කු, 1928 ජූලි මස 13 වන දින අංක 7654 දරන ගැසට් පත්‍රයේ පළවූ අංක 178 දරන සුරාබදු නිවේදනයේ විධි විධාන වලට අනුකූලව පරීක්ෂා කර බලන ලදුව, ඒ සඳහා තත්කාලයේ වලංගු අරක්කු රේන්ද විකිණීමේ කොන්දේසි මාලාව යටතේ වූ නිවේදනය මගින් සුරාබදු කොමසාරිස් විසින් නියම කරන ලද සැර ප්‍රමාණයට අඩු හෝ වැඩි හෝ නොවූ සැර ප්‍රමාණයකින් යුක්ත විය යුතුය. ඒ අරක්කු වලට වතුර, යම්කිසි පාටක්, සුවඳක්, නැතහොත් රසක් ඇතිකිරීම සඳහා එකතුකරන ද්‍රව්‍යයක් හෝ අන්කිසි ද්‍රව්‍යයක් එකතු කිරීම නොකළ යුතුය.

8. 1 වන කොන්දේසියේ සඳහන් කරන ලද තැබෑරුමේ අරක්කු තොග නොවැනි අවස්ථාවලදී හෝ සුරාබදු කොමසාරිස් විසින් බලපත්‍රධාරියා/ධාරින් වෙත තබාගතයුතු බවට විශේෂ මාසික සලාකයක් නියම කොට ඇති අවස්ථාවලදී හැර අන් සෑම අවස්ථාවකදීම බලපත්‍රධාරියා/ධාරීන් විසින් බෝතලගත අරක්කු ගැලුම් දෙකකට නොඅඩු ප්‍රමාණයක් තමන් වෙත තබාගත යුතුය.

9. කලින් කල සුරාබදු කොමසාරිස් විසින් නියම කර ඇති මිල ගණන් වලට හැර අන් මිල ගණනකට අරක්කු ඩ්‍රෑම වශයෙන් හෝ බෝතල් වශයෙන් විකිණීම නොකළ යුතුය. මෙම බලපත්‍රය යටතේ විකුණනු ලබන අරක්කු සම්බන්ධයෙන් බලපත්‍රධාරියා/ධාරින් විසින් කිසියම් සේවා ගාස්තුවක් හෝ වෙනත් කිසිම අන්දමක අතිරේක ගාස්තුවක් අයකිරීම නොකළ යුතුය.

10. ඩ්‍රෑම් වශයෙන් සහ බෝතල් වශයෙන් විකිණීම සඳහා තබා ඇති අරක්කු විකුණන මිල ඉලක්කමෙන්ද සිංහල, දෙමළ හා ඉංග්‍රීසි අකුරින්ද පැහැදිලි ලෙස දැක්වෙන පත්‍රිකාවක් අරක්කු මිලට ගැනීමට පැමිණෙන සෑම දෙනාටම පහසුවෙන් කියවීමට හැකිවන පරිදි බලපත්‍රලත් ස්ථානයෙහි ප්‍රකටව පෙනෙන ස්ථානයක අලවා තැබිය යුතුය.

11. (අ) බලපත්‍රධාරියා/ධාරින් විසින් මිළට ගත්තා වූද විකුණනු ලබන්නා වූද එක් එක් අරක්කු වර්ගය සහ එක් එක් බෝතල් වර්ගය සඳහා වෙන වෙනම පිටු වෙන්කරන ලද ලේඛනයක, මෙහි පහත නියම කර ඇති ආකෘතිපත්‍රයේ ප්‍රකාරයට ගිණුම් තබා ගතයුතුය :—

අරක්කු ලේඛනය (ගැලුම් සහ ඩ්‍රෑම් ප්‍රමාණ වලින්)

වර්ගය : ............

| (1) මාසය | (2) අවසර පත්‍ර අංකය | (3) අතේ ඉතුරු ප්‍රමාණය | (4) ලැබී ඇත | (5) මුළු ගණන | (6) විකුණා ඇත | (7) ඉතුරු ප්‍රමාණය |
|---|---|---|---|---|---|---|
| | | | | | | |

දින 1 සිට 31 දක්වා

12. ඉහත 1 වන කොන්දේසියේ සඳහන් අරක්කු තැබෑරුමෙන් ඉවත්ව යන රේන්දකරුගෙන් නුවුවමනා ප්‍රමාණයේ විශාල අරක්කු තොගයක් තමන් විසින් මිලට ගනු ලැබීම සිදු නොවනු වස්, මේ බලපත්‍රය අවසන් වන අවුරුද්දේ ඔක්තෝබර් මස 15 වන දින සිට දෙසැම්බර් මස 15 වන දින දක්වා වූ කාල පරිච්ඡෙදය තුළ අලෙවි වූ අරක්කු ප්‍රමාණය පදනම් කොටගෙන දින 10ක සාමාන්‍ය අලෙවි ප්‍රමාණයට වැඩි වන අරක්කු තොගයක් එම අවුරුද්දේ දෙසැම්බර් මස 31 වන දින වනවිට තමා ලඟ තබා නොගැනීමට බලපත්‍රධාරියා/ධාරින් වග බලා ගතයුතුය.

13. පරීක්ෂක ශ්‍රෙණියට අඩු නොවන තත්වයක් උසුලන සුරාබදු නිලධාරින්ට අරක්කු රැස්කර තබා ඇති සිල් බෝතල් බැලීමටද ඒවායේ ඇතුළත්ව ඇති අරක්කු වල සැර ප්‍රමාණය සහ තොග ගණන් මෙන්ම ඒවායේ ගණන් තිලව් පරීක්ෂා කිරීමට ද බලපත්‍ර දරණ ස්ථානය අරක්කු විකිනීම සඳහා විවෘත කර තිබෙන සියලුම වේලාවලදී ඉඩ දිය යුතුය.

14. මේ බලපත්‍රය සම්බන්ධයෙන්, ස්වකීය කළමනාකරුවන්, නියෝජිතයන් සහ සේවකයන් විසින් කරනු ලබන සියලුම ක්‍රියා ගැන බලපත්‍රධාරියා/ධාරින් වගකිවයුතුය.

15. ලියවිල්ලකින් වූ අනුමතය පළමුව සුරාබදු කොමසාරිස්ගෙන් ලබාගෙන මිස මේ බලපත්‍රය අන්සතු කළ නොහැකිය.

16. මේ බලපත්‍රය ඉල්ලා එවූ අයදුම්පත සමඟ බලපත්‍රධාරියා/ධාරින් විසින් තැන්පත් කරනලද රුපියල් 1,000ක මුදල මේ බලපත්‍රයේ සාමාන්‍ය සහ විශේෂ කොන්දේසි යථා පරිදි ඉටු කරනු ලබන බවට ඇපයක් වශයෙන් සුරාබදු කොමසාරිස් විසින් තබාගනු ලබන අතර, මේ කොන්දේසි වලින් යමක් කඩකිරීම සම්බන්ධයෙන් එකී සම්පූර්ණ මුදල හෝ එහි යම් කොටසක්, මේ කොන්දේසි කඩකිරීම සම්බන්ධයෙන් ආඥා පණතේ සලස්වා ඇති දණ්ඩන නියමයන් පැනවීමට අමකරව සුරාබදු කොමසාරිස්ගේ පරම අභිමතය පරිදි රාජ්‍ය සන්තක කරනු ලැබීමටද යටත් වන්නේය.

17. තම අරක්කු තොගය සම්පූර්ණයෙන්ම හෝ කොටසක් තමන් වෙත සපයනු ලැබීමට අපොහොසත්වීම සම්බන්ධයෙන් හෝ රේන්ද කාරයා විසින් කරන ලද යම් කිසි ක්‍රියාවක් ඔහු පැහැර හැරීමක් නිසා සිදුවන යම්කිසි පාඩුවක් හෝ අලාභයක් සම්බන්ධයෙන් හෝ වෙන යම් කවර වූ හෝ හේතුවක් සම්බන්ධයෙන් සුරාබදු කොමසාරිස්ගෙන් හෝ ශ්‍රී ලංකා ආණ්ඩුවෙන් කිසිදු හිමිකම්පෑමක් කිරීමට බලපත්‍රධාරියා/ධාරින්ට අයිතියක් නොතිබිය යුතුය.

18. කලින් අවලංගු කරනු ලැබුවහොත් මිස මේ බලපත්‍රය ............ වන දින සිට 19...... ක්වූ ............ මස් 31 වන දින තෙක් වලංගුව පවත්නේය.

සුරාබදු කොමසාරිස්.

වර්ෂ 19...... ක්වූ ............ මස ...... වැනි දින,

කොළඹ,

සුරාබදු කොමසාරිස් කාර්යාලයේ දී,

ගාස්තුව : රු. :————.

තානායම්වල හෝ (මෙරට නිෂ්පාදිත ධාන්‍ය මත්පැන් ද ඇතුළුව) රට බීම විකිණීම සඳහා විශේෂයෙන් බලපත්‍රලත් ස්ථානවල හෝ අරක්කු විකිණීම සඳහා දෙන බලපත්‍රයයි

බලපත්‍රධාරියාගේ නම :————.

බලපත්‍රලත් ස්ථානයේ විස්තරය :————.

නිකුත් කළ දිනය :————.

අවසාන වන දිනය :————.

| |
|---|
| රු. 1 ක මුද්දර |

————,
සුරාබද්දු කොමසාරිස්.

19 ක්වූ....... ...... .. මස... . . වන දින,
කොළඹ, සුරාබද්දු කොමසාරිස් කාර්යාලයේ දීය.

අනුපූරණ ගිවිසුම

තත් කාලයේ වලංගු සුරාබද්දු බලපත්‍ර සම්බන්ධයෙන් අදාළ පොදු කොන්දේසි මාලාවට ද, මේ බලපත්‍රයට අදාළ පහත සඳහන් විශේෂ කොන්දේසිවලට ද යටත්ව, 19 ක්වූ දෙසැම්බර් මස 31 වන දින අවසන් වන කාර්යාලයීය වර්ෂය තුළ මෙහි ඉහත සම්පූර්ණ වශයෙන් විස්තර කර ඇති ස්ථානයෙහි අරක්කු විදුරු ගණනේ විකිණීමට ඉහත නම් සඳහන් බලපත්‍රධාරියා/ධාරීන් වන මට/අපිට ලැබී ඇති බලපත්‍රයෙහි (මේ වනාහි එහි අනුපිටපතකි) ඇතුලත් නියම හා කොන්දේසි හොඳින්ත්, අවංක ලෙසත්, පිළිපදිනු ලබන බවටද, ඉෂ්ට කරනු ලබන බවටද එකී බලපත්‍රධාරියා/ධාරීන් වන.................................... නමැති මම/අපි සුරාබද්දු කොමසාරිස්ට මෙයින් පොරොන්දු වෙමි/වෙමු.

1. බලපත්‍රධාරියා/ධාරීන් විසින් අරක්කු ලබාගත යුත්තේ.................................... දිස්ත්‍රික්කයේ....................... පිහිටි.......................... වන අංකය දරන අරක්කු තැබැරුමෙන් පමණකි. ඒද (මෙහි මින්මතු ''රේන්දකරු'' යයි කියනු ලබන) ඒ තැබැරුමේ රේන්දකරුට, මහජනයාට අරක්කු විකිණීමට නීතියෙන් බලය ලැබී ඇති මිල ගණනකට පමණකි.

2. (අ) සුරාබද්දු අධිකාරී විසින් නිකුත් කරනු ලබන අවසර පත්‍රයක් අධිකාරය යටතේ මිස, එකී තැබැරුමේ සිට බලපත්‍ර ලත් ස්ථානයට අරක්කු කිසිවක් ගෙන නොයා යුතුය. එය නිකුත් කරනු ලබන දිනයේ ප.ව. 6ට පසු කවර වේලාවකදී වත් කිසිම අවසර පත්‍රයක් පාවිච්චි කිරීමට ඉඩ දෙනු නො ලැබේ.

(ආ) එවැනි සියලුම අවසර පත්‍ර බලපත්‍ර ලත් ස්ථානයෙහි ලිපිගොනුවකට අමුණා ඒ ඒ අවසර පත්‍රය නිකුත් කරනු ලැබූ දිනයේ පටන් දොළොස් මාසයක් ගත වන තුරු පරීක්ෂාකිරීම සඳහා ඉදිරිපත් කළ හැකි වන අයුරු තබා ගත යුතුය.

3. බෝතල ගණනේ අරක්කු විකිණීම තහනම්ය. මේ කොන්දේසිය සම්පූර්ණ වශයෙන්ම හෝ අර්ධ වශයෙන් හෝ විශේෂයෙන් නොසලකා හැරීමට සුරාබද්දු කොමසාරිස්ට පුළුවන.

4. බලපත්‍රධාරියා/ධාරීන් විසින් අරක්කු විකිණිය යුත්තේ විදුරු ගණනේ පමණකි. ඒද විදුරුවකට වත්කර හුදෙක්ම බලපත්‍රලත් ස්ථානයේදී පරිභෝජනය කිරීම සඳහාය. භාජනවලට වත්කර බලපත්‍රලත් ස්ථානයෙන් පිටතට ගෙන යෑම පිණිස අරක්කු විකිණීම තහනම්ය.

5. අරක්කු වෙළඳාම කරගෙන යා යුත්තේ බලපත්‍රධාරියා/ධාරීන් ළඟ තිබෙන රටබීම බලපත්‍රයෙන් රටබීම විකිණීමට අවසර දී ඇති වේලාවල්, මිලට ගන්නවුන්ගේ පංතිය හා ව්‍යාපාරයේ ස්වභාවය, යන මේ කරුණු සම්බන්ධයෙන් පනවා ඇති තහනම්වලටම යටත්වය.

6. මේ බලපත්‍රය යටතේ විකුණනු ලබන්නාවූ හෝ විකිණීම පිණිස තබා ඇත්තාවූ හෝ සියලුම අරක්කු, වූකලී 1928 ජූලි මස 13 වන දින අංක 7,654 දරන ගැසට් පත්‍රයේ පලවූ අංක 178 දරන සුරාබද්දු නිවේදනයේ විධිවිධාන වලට අනුකූලව පරීක්ෂා කර බලන ලදුව, ඒ සඳහා තත්කාලයේ අරක්කු රේන්ද විකිණීමේ කොන්දේසි මාලාව යටතේ වූ නිවේදනය මගින් සුරාබද්දු කොමසාරිස් විසින්, නියම කරන ලද සැර ප්‍රමාණයට අඩු නුවූ හෝ වැඩි නොවූ සැර ප්‍රමාණයක් ඇතුලත් අරක්කු විය යුතුය. ඒ අරක්කුවලට වතුර හෝ, යම්කිසි පාටක් හෝ සුවඳක්, හෝ රසක් හෝ ඇති කිරීම සඳහා එකතු කරන ද්‍රව්‍යයක් හෝ අන් කිසි ද්‍රව්‍යයක් හෝ එකතු නොකළ යුතුය.

7. 1 වන කොන්දේසියේ සඳහන් කරන ලද අරක්කු තැබැරුමේ අරක්කු නොමැති අවසන් වූ අවස්ථාවලදී හෝ, සුරාබද්දු කොමසාරිස් විසින් බලපත්‍රය සඳහා විශේෂ මාසික සලාකයක් නියම කොට ඇති අවස්ථාවලදී හෝ මිස අනික් හැම විටකදීම බලපත්‍රධාරියා/යන් විසින් ගැලොම් එකකට නොඅඩු අරක්කු ප්‍රමාණයක් තමන් ළඟ තබාගත යුතුය.

8. කලින් කල සුරාබද්දු කොමසාරිස් විසින් නියම කර ඇති මිල ගණන් වලට හැර, අන් මිල ගණනකට ඩ්‍රෑම් ගණනේ හෝ විදුරු ගණනේ අරක්කු නොවිකිණිය යුතුය.

9. සුරාබද්දු කොමසාරිස් විසින් අනුමත කරන ලද ඩ්‍රෑම් 1¼, ඩ්‍රෑම් 1, ඩ්‍රෑම් ¾, ඩ්‍රෑම් ½, ඩ්‍රෑම් ¼ යන මේ සම්මත මිනුම් තබා ගත යුතු අතර අරක්කු මිලට ගන්නා කෙනෙකු තමා මිලට ගන්නා අරක්කු ප්‍රමාණය යථෝක්ත සම්මත මිනුමකින් මැන දෙන ලෙස ඉල්ලා සිටියහොත්, එකී මිනුම් භාවිත කළ යුතුය.

10. බලපත්‍රධාරියා/ධාරීන් විසින් ඩ්‍රෑම් ගණනේ විකිණීම සඳහා ඉදිරිපත් කෙරෙන අරක්කු විකුණන මිල ඉලක්කමෙන්ද සිංහළ, දෙමළ හා ඉංග්‍රීසි අකුරෙන්ද පැහැදිලි ලෙස මුද්‍රණය කළ කාඩ් පතක් අරක්කු මිළ දී ගැනීමට පැමිණෙන සැම දෙනාටම පහසුවෙන් කියවන්නට හැකිවන පරිද්දෙන්, බලපත්‍රලත් ස්ථානයෙහි ප්‍රකටව පෙනෙන තැනක ප්‍රදර්ශනය කළ යුතුය.

11. බලපත්‍රධාරියා/ධාරීන් විසින් මිලට ගන්නාවූද විකුණනු ලබන්නාවූද එක් එක් අරක්කු වර්ගය සඳහා වෙන වෙනම පිටු වෙන් කරන ලද ලේඛනයක මෙහි පහත නියමකර ඇති ආකෘති පත්‍රයේ ප්‍රකාරයට ගිණුම් තබාගත යුතුය.

බෝතල් අරක්කු ලේඛනය (ගැලොම්වලින් හා ඩ්‍රෑම්වලින්)

වර්ගය : ...........................

| (1) මාසය | (2) අවසරපත්‍ර අංකය | (3) අතේ ඉතුරුව | (4) ලැබුණා | (5) මුළු ගණන | (6) වික්කා | (7) ඉතිරි |
|---|---|---|---|---|---|---|
| දින 1 සිට 31 වන දින තෙක් | | | | | | |

12. බලපත්‍රලත් ස්ථානයෙහි හෝ ඊට අයත් යම්කිසි බිම් ගෙයක හෝ ඊට සම්බන්ධ වෙන යම් ගොඩනැගිල්ලක හෝ නිෂ්පාදකයාගේ මුද්‍රාවට සමාන මුද්‍රාවක් ගැසිය හැකි, කිසිම උපකරණයක් තබා නොගත යුතුය. මේ කොන්දේසිය සම්පූර්ණ වශයෙන්ම, හෝ අර්ධ වශයෙන් හෝ විශේෂයෙන් අත් හැරීමට සුරාබද්දු කොමසාරිස්ට පුළුවන.

බෝතල් අරක්කු ලේඛනය (ගැලුම් වලින් හා ඩිග්‍රම් වලින්)

වර්ගය :..............................

| (1) මාසය | (2) අවසර පත්‍ර අංකය | (3) අතේ ඉතුරු | (4) ලැබුණු | (5) මුළු ගණන | (6) විකුණු | (7) ඉතුරු |
|---|---|---|---|---|---|---|
| දින 1 සිට 31 වන දින තෙක් | | | | | | |

12. බලපත්‍රලත් ස්ථානයෙහි හෝ ඊට අයත් යම්කිසි බිම් ගෙයක හෝ ඊට සම්බන්ධ වෙනයම් ගොඩනැගිල්ලක හෝ නිෂ්පාදකයාගේ මුද්‍රාවට සමාන මුද්‍රාවක් ගැසිය හැකි, කිසිම උපකරණයක් තබා නොගත යුතුය. මේ කොන්දේසිය සම්පූර්ණ වශයෙන්ම, හෝ අර්ධ වශයෙන් හෝ විශේෂයෙන් අත්හැරීමට සුරාබදු කොමසාරිස්ට පුළුවන.

13. පූර්වෝක්ත 1 වන කොන්දේසියේ සඳහන් අරක්කු තැබැරුමෙන් ඉවත්ව යනෙ රෙන්දකරුගෙන් නුවමනා ප්‍රමාණයේ විශාල අරක්කු තොගයක් තමන් විසින් මිලදී ගැනීමට සිදු නොවන පරිදි මේ බලපත්‍රය අවසාන වන අවුරුද්දේ ඔක්තෝබර් මස 15 වන දින පටන් දෙසැම්බර් මස 15 වන දින තෙක්වූ කාල පරිච්ඡේදය තුළ අලෙවි වූ අරක්කු ප්‍රමාණයන් පදනම් කොට, දින දහයක සාමාන්‍ය අලෙවි වූ සාමාන්‍ය ප්‍රමාණයට වැඩි වන අරක්කු තොගයක් එම අවුරුද්දේ දෙසැම්බර් 31 වන දින වන විට තමා ළඟ තබා නොගැනීමට බලපත්‍රධාරියා/ධාරීන් විසින් වග බලාගත යුතුය.

14. පරීක්ෂක ශ්‍රේණියට අඩු නොවූ තත්වයක් උසුලන සුරාබදු නිලධාරීන්ට, අරක්කු විකිණීම සඳහා ස්ථානය හැර තිබෙන සියළුම වේලාවලදීම එම අරක්කුවල සැර ප්‍රමාණය තොග ගණන් මෙන්ම ඒවායේ ගණන් හිලව් ද පරීක්ෂා කිරීමට අවකාශ දිය යුතුය.

15. මේ බලපත්‍රය සම්බන්ධයෙන්, ස්වකීය කළමනාකරුවන්, නියෝජිතයන් හා සේවකයන් කරන සියලුම ක්‍රියාවන් ගැන බලපත්‍රධාරියා/ධාරීන් වග කිව යුතුය.

16. පළමු කොට සුරාබදු කොමසාරිස්ගෙන් ලියවිල්ලකින් වූ අනුමතය තබා ගෙන මිස, මේ බලපත්‍රය අන් කිසිවකුට පැවරීම තහනම්ය.

17. මේ බලපත්‍රය ඉල්ලා එවූ අයදුම් පතක් සමඟ බලපත්‍රධාරී/ධාරීන් විසින් තැන්පත් කරන ලද රු. 100/- මුදල පොදු කොන්දේසිද මේ බලපත්‍රයේ විශේෂ කොන්දේසිද යථා පරිදි ඉෂ්ට කරනු ලබන බවට ඇපයක් වශයෙන් සුරාබදු කොමසාරිස් ළඟ තබා ගනු ල නතර මේ කොන්දේසි වලින් යමක් කඩ කිරීම සම්බන්ධයෙන් ආඥාපනතෙන් සලසා ඇති දණ්ඩන නියමයන් පැනවීමට අතිරේක වශයෙන් මේ කොන්දේසි වලින් යමක් කඩ කිරීම සම්බන්ධයෙන්, සුරාබදු කොමසාරිස්ගේ අභිමතය පරිදි එකී මුදල සම්පූර්ණයෙන්ම හෝ එහි කොටසක් හෝ රාජසන්තක කරනු ලැබීමට ද යටත් වන්නේය.

18. සම්පූර්ණ වශයෙන්ම හෝ අර්ධ වශයෙන් හෝ තමන්ට අරක්කු නොසපයනු ලැබීම සම්බන්ධයෙන් වත්, රේන්දකරු කරන යම් කිසි ක්‍රියාවක් හෝ ඔහු පැහැර හරින යම්කිසි ක්‍රියාවක් හෝ නිසා සිදුවන යම්කිසි පාඩුවක් හෝ අලාභයක් සම්බන්ධයෙන්වත්, වෙන යම් කවර හේතුවක් සම්බන්ධයෙන් වත්, සුරාබදු කොමසාරිස්ගෙන් හෝ ලංකාණ්ඩුවෙන් හෝ අලාභය ඉල්ලා කිසිම අයැදුමක් කිරීමට බලපත්‍රධාරියාට/ධාරීන්ට හිමිකමක් නැත්තේය.

19. ..............................................................වශයෙන් ස්වකීය රක්ෂාව පවත්නේ යම් කාල පරිච්ඡේදයක් සඳහා ද ඒ කාල පරිච්ඡේදය සඳහන් පමණක්, මේ බලපත්‍රය, කලින් අවලංගු කරනු ලැබුවහොත් මිස..............................................වන දින පටන් 19...............ක්වූ දෙසැම්බර් මස 31 වන දින තෙක් වලංගුව පවත්නේය.

සුරාබදු කොමසාරිස්.

වර්ෂ 19...............ක්වූ.................මස..................වන දින,
කොළඹ, සුරාබදු කොමසාරිස් කාර්‍යාලයේ දීය.

ගාස්තුව රු;................................

(පිටත ගෙන ගොස් පරිභෝජනය කිරීම සඳහා) රට බීම හිල්ලරට විකිණීම සඳහා බලපත්‍රලත් ස්ථානවල (ඒ ස්ථානවලදී පරිභෝජනය පිණිස නොව) බෝතල ගණනේ පමණක් අරක්කු විකිණීම සඳහා දෙන බලපත්‍රය

බලපත්‍රධාරියාගේ නම :————.

බලපත්‍රලත් ස්ථානයේ විස්තර :————.

නිකුත් කළ දිනය :————.

අවසාන වන දිනය :————.

රු. 1/- ක මුද්දර

..........................................
සුරාබදු කොමසාරිස්.

19............ක්වූ............... මස............ වන දින,
කොළඹ, සුරාබදු කොමසාරිස් කාර්‍යාලයේ දීය.

අනුපූර්ණ ගිවිසුම

තත් කාලයේ වලංගු සියලු සුරාබදු බලපත්‍ර වලට අදාළ පොදු කොන්දේසි මාලාවටද, මේ බලපත්‍රයට අදාළ පහත සඳහන් විශේෂ කොන්දේසිවලටද, යටත්ව, 19............ක්වූ දෙසැම්බර් මස 31 වන දින අවසන් වන කාර්‍යාලීය වර්ෂය තුළ මෙහි ඉහත සම්පූර්ණ වශයෙන් විස්තර කර ඇති ස්ථානයෙහි අරක්කු බෝතල ගණනේ පමණක් විකිණීමට ඉහත නම් සඳහන් බලපත්‍රධාරියා/ධාරීන්වන මම/අපි බලපත්‍රයෙහි (මේ වනාහි එහි අනු පිටපතකි) ඇතුළත් නියම හා කොන්දේසි හොඳිනුත්, අවංක ලෙසත් පිළිපදිනු ලබන බවටද ඉෂ්ට කරනු ලබන බවටද එකී බලපත්‍රධාරියා/ධාරීන් වන...................................නැමැති මම/අපි සුරාබදු කොමසාරිස්ට මෙයින් පොරොන්දු වෙමි/වෙමු.

විශේෂ කොන්දේසි :

1. සිල් බෝතලවල පමණක් සහ...........................දිස්ත්‍රික්කයේ.................................හි පිහිටි අංක.....................දරණ තැබැරුමෙන් පමණක් එකී තැබැරුමෙහි (මෙහි මින් මතු "රේන්දකරු" යනුවෙන් හඳුන්වනු ලබන) රේන්දකරුට මහජනයා වෙත සිල් බෝතල අරක්කු විකිණීමට නීතියෙන් බලය ලැබී ඇති මිලට බලපත්‍රධාරියා/ධාරීන් විසින් අරක්කු ලබාගත යුතුය. කෙසේ වෙතත්, නිසි පරිදි, අනුමත කරනු ලැබූ ස්ථානයක, "පදම් කළ අරක්කු","ඉක්ෂුපාක අරක්කු" හෝ "උක් අරක්කු" හෝ නිපදවීමට බලපත්‍රයක් නිකුත් කරනු ලැබූ තැනැත්තෙකුගෙන්, සුරාබදු අධිකාරී විසින් නිකුත් කරනු ලැබූ අවසර පත්‍රයක් මත "පදම් කල අරක්කු" " ඉක්ෂුපාක අරක්කු " හෝ "උක් අරක්කු" හෝ සිල් බෝතලවල ලබා ගැනීමටද හැකිය

2. (අ) සුරාබදු අධිකාරි විසින් නිකුත් කරනු ලබන අවසර පත්‍රයක අධිකාරය යටතේ මිස, එකී තැබැරුමේ සිට බලපත්‍ර ලත් ස්ථානයට සීල් බෝතල් අරක්කු කිසිත් ගෙන නොයා යුතුය. එය නිකුත් කරනු ලබන දිනයේ ප.ව. 6 ට පසු කවර වෙලා වකදීවත් කිසිම අවසර පත්‍රයක් පාවිච්චි කිරීමට ඉඩ දෙනු නොලැබේ.

(ආ) එවැනි සියලුම අවසර පත්‍ර බලපත්‍රලත් ස්ථානයෙහි ලිපි ගොණුවක යොදා ඒ ඒ අවසර පත්‍රය නිකුත් කරනු ලැබූ දිනයේ පටන් දෙළොස් මාසයක් ගතවන තුරු පරීක්ෂා කිරීම සඳහා ඉදිරිපත් කළ හැකිවන අයුරු තබාගත යුතුය.

3. අරක්කු විකිනීම සීල් බෝතල් ගණනේ පමණක් විය යුතු අතර ස්ථානයෙන් පිටතට ගෙන ගොස් පරිභෝජනය කිරීම සඳහා විය යුතුය. ඒ ස්ථානයේදී සීල් අරක්කු බෝතල ඇරීම ද වීදුරු ගණනේ විකිණීමද තහනම්ය.

4. වලංගු අවසර පත්‍රයක් නොමැතිව කිසියම් පුද්ගලයකුට එක්වරකට ඉම්පීරියල් ගැලුමකින් තුනෙන් එක් කොටසකට වැඩි වූ අරක්කු ප්‍රමාණයක් ඇතුළත් සීල් බෝතල් විකිණීම හෝ බලපත්‍ර ලත් ස්ථානයෙන් පිටතට ගෙන යාමට ඉඩදීම හෝ බලපත්‍රධාරියා/ධාරින් විසින් නොකළ යුතුය. සුරාබදු බලපත්‍ර සියල්ලම සම්බන්ධයෙන් අදළ පොදු කොන්දේසි මාලාවේ 14 වන කොන්දේසියේ මීට විරුද්ධව කුමක් සඳහන්ව තිබුණත් තමා මිලදී ගැනීමට බලාපොරොත්තුවන අරක්කු ගැලුම් ප්‍රමාණය වත්කර තිබෙන බෝතල් ගණන වෙනුවෙන් හිස් බෝතල් ගණනක් නොගෙනෙනු ලබන්නාවූ යම් කෙනෙකුට අරක්කු විකිණීම, තම අභිමතය පරිදි ප්‍රතික්ෂේප කිරීමට බලපත්‍රධාරියා/ධාරින්ට පුළුවන.

5. බලපත්‍ර ලත් ස්ථානයෙන් පිටතට ගෙන ගොස් පරිභෝජනය කිරීම සඳහා සීල් බෝතල් අරක්කු විකිණිය යුත්තේ බලපත්‍රධාරියා/ධාරින් සතුව ඇති (පිටත ගෙනගොස් පරිභෝජනය කිරීම සඳහා) රට බීම සිල්ලරට විකිණීමේ බලපත්‍රයෙන් රටබීම විකිණීමට අවසර දී ඇති වේලාවලට අදල පනවා ඇති සීමාවන්ට යටත්වය.

6. මේ බලපත්‍රය යටතේ විකුණනු ලබන්නාවූ හෝ විකිණීම පිණිස තබා ඇත්තාවූ හෝ සියළුම අරක්කු 1928 ජූලි මස 13 වන දින හා අංක 7,654 දරණ ගැසට් පත්‍රයේ පලවූ අංක 178 දරන සුරාබදු නිවේදනයේ විධිවිධාන වලට අනුකූලව පරීක්ෂා කර ලන ලදුව, ඒ සඳහා තත් කාලයේ වලංගු අරක්කු රේන්ද විකිණීමේ කොන්දේසි මාලාව යටතේ වූ නිවේදනය මගින් සුරාබදු කොමසාරිස් විසින් නියම කරන ලද සැර ප්‍රමාණයට අඩු නුවූ හෝ වැඩි නොවූ ප්‍රමාණයක ඇතුළත් අරක්කු විය යුතුය. ඒ අරක්කු වලට වතුර හෝ යම්කිසි පාටක් හෝ සුවඳක් හෝ රසක් හෝ ඇති කිරීම සඳහා එකතු කරන ද්‍රව්‍යයක් හෝ අන් කිසි ද්‍රව්‍යයක් හෝ එකතු නොකළ යුතුය.

7. 1 වන කොන්දේසියේ සඳහන් කරන ලද අරක්කු තැබැරුමේ අරක්කු තොග අවසන් වූ අවස්ථාවලදී, හෝ සුරාබදු කොමසාරිස් විසින් බලපත්‍රය සඳහා යම්කිසි විශේෂ සලාක ප්‍රමාණයක් නියම කොට ඇති අවස්ථාවලදී හෝ මිස අනික් හැම විටකදීම බලපත්‍රධාරියා/ධාරින් විසින් සීල් බෝතල් වලින් අරක්කු ගැලුම් දෙකකට නොඅඩු අරක්කු ප්‍රමාණයක් තමන් ලඟ තබාගත යුතුය.

8. කලින් කල සුරාබදු කොමසාරිස් විසින් අනුමත කර ඇති මිළගණන් වලට හැර අන් මිළ ගණනකට සීල් බෝතල් අරක්කු නොවිකිණිය යුතුය. කිසියම් අරක්කු වර්ගයක් විකුණනු ලබන විටක : බලපත්‍රධාරියා විසින් ඒ අරක්කු වෙනුවෙන් යම් සේවා ගාස්තුවක් හෝ කිසියම් අන්දමක අතිරේක ගාස්තුවක් අය නොකළ යුතුය.

9. මේ ලපත්‍රය යටතේ විකුණනු ලබන සීල් බෝතල් අරක්කු බලපත්‍ර ලත් ස්ථානයේදීම පරිභෝජනය කිරීම සඳහා නොවිකිණිය යුතුය.

10. බලපත්‍රධාරියා/ධාරින් විසින් මිලට ගත්තාවූද විකුණනු ලබන්නාවූද සියළුම අරක්කු පිළිබඳ ගිණුමක් මෙහි පහත සඳහන් ආකෘති පත්‍රයෙහි ප්‍රකාරයට ලියා තබා ගත යුතුය. තමන් ලඟ ගබඩා කර තිබෙන එක් එක් අරක්කු වර්ගය පිළිබඳව ලේඛනයෙහි පිටු වෙන් වශයෙන් තබා ගත යුතුය.

**බෝතල් අරක්කු ලේඛනය (ගැලුම්වලින් හා ඩ්‍රෑම් වලින්)**

වර්ගය : ....................................

| (1) මාසය | (2) අවසර පත්‍ර අංකය | (3) අතේ ඉතිරි මා[illegible]ය | | (4) ලැබී ඇත | | (5) මුළු ගණන | | (6) විකුණා ඇත | | (7) ඉතිරි ප්‍රමාණය | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | සම්මත කාර්තු | සම්මත පයින්ට් | සම්මත කාර්තු | සම්මත පයින්ට් | සම්මත කාර්තු | සම්මත පයින්ට් | සම්මත කාර්තු | සම්මත පයින්ට් | සම්මත කාර්තු | සම්මත පයින්ට් |
| දින 1 සිට 31 වන දින තෙක් | | | | | | | | | | | |

11. නිෂ්පාදකයාගේ ලේබල් සහ ශීර්ෂ කෝෂ හෝ මුද්‍රාව නොකැඩූ සීල් බෝතල් අරක්කු හැර වෙන අරක්කු කිසිවක්වත් අරක්කු බෝතල සඳහා පාවිච්චි කෙරෙන වර්ගයේ ශීර්ෂ කෝෂ හෝ මුද්‍රාවක්වත් නිෂ්පාදකයා ගේ මුද්‍රාවට සමාන මුද්‍රාවක් තැබිය හැකි කිසිම උපකරණයක් බලපත්‍රලත් ස්ථානයෙහි හෝ ඊට අයත් යම්කිසි බිහි ගෙයක හෝ ඊට සම්බන්ධ අන් කිසි ගොඩනැගිල්ලක හෝ තබා නොගත යුතුය.

12. ඉහත 1 වන කොන්දේසියේ සඳහන් අරක්කු තැබැරුමෙන් ඉවත්ව යන රේන්දකරුවන්ගෙන් නුවූමනා ප්‍රමාණයේ විශාල අරක්කු තොගයක් තමන් විසින් මිලට ගනු ලැබීම සිදු නොවනු වස්, මේ බලපත්‍රය අවසන් වන අවුරුද්දේ ඔක්තෝබර් මස 15 වන දින සිට දෙසැම්බර් මස 15 වන දින දක්වා වූ කාලපරිච්ඡේදයතුළ අලෙවි වූ අරක්කු ප්‍රමාණය පදනම් කොට ගෙන දින දහයක සාමාන්‍ය අලෙවි ප්‍රමාණයකට වැඩි වන අරක්කු තොගයක් එම අවුරුද්දේ දෙසැම්බර් මස 31 වන දින වන විට තමා ළඟ තබා නොගැනීමට බලපත්‍රධාරියා/ධාරින් වග බලාගත යුතුය.

13. පරීක්ෂක ශ්‍රේණියට අඩු නොවූ තත්වයක් උසුලන සුරාබදු නිලධාරින්ට සීල් බෝතල් අරක්කු විකිණීම සඳහා ස්ථානය හැර තිබෙන සියළුම වේලාවලදීම ඒ අරක්කුවල සැර ප්‍රමාණයද තොග ගණන් මෙන්ම ගණන් හිලවුද පරීක්ෂා කිරීමට අවකාශ දිය යුතුය.

14. මේ බලපත්‍රය සම්බන්ධයෙන්, ස්වකීය කළමනාකාරවරුන්, නියෝජිතයන් හා සේවකයන් කරන සියළුම ක්‍රියාවන් ගැන බලපත්‍රධාරියා/ධාරින් වගකිව යුතුය.

15. පළමුකොට සුරාබදු කොමසාරිස්ගේ ලියවිල්ලකින් වූ අනුමැතිය ලබාගෙන මිස මේ බලපත්‍රය අන් කිසිවකුට පැවරීම තහනම්ය.

16. මේ බලපත්‍රය ඉල්ලා එවූ අයදුම්පත සමඟ බලපත්‍රධාරියා/ධාරින් විසින් තැන්පත් කරන ලද රුපියල් 1000 ක මුදල මේ බලපත්‍රයේ සාමාන්‍ය සහ විශේෂ කොන්දේසි යථා පරිදි ඉටු කරනු ලබන බවට ඇපයක් වශයෙන් සුරාබදු කොමසාරිස් විසින් තබා ගනු ලබන අතර, මේ කොන්දේසි වලින් යමක් කඩ කිරීම සම්බන්ධයෙන් එකී සම්පූර්ණ මුදල හෝ එහි යම් කොටසක්, මේ කොන්දේසි කඩ කිරීම සම්බන්ධයෙන් ආඥපනතේ සලස්වා ඇති දණ්ඩන නියමයන් පැනවීමට අමතරව සුරාබදු කොමසාරිස් ගේ පරම අභිමතය පරිදි රාජ්‍ය සන්තක කරනු ලැබීමටද යටත් වන්නේය.

17. තම අරක්කු තොගය සම්පූර්ණයෙන්ම හෝ කොටසක් තමන් වෙත සපයනු ලැබීමට අපොහොසත් වීම සම්බන්ධයෙන් හෝ රේන්දකරු විසින් කරන ලද යම්කිසි ක්‍රියාවක් හෝ පැහැර හැරීමක් නිසා සිදුවන යම්කිසි පාඩුවක් හෝ අලාභයක් සම්බන්ධයෙන් හෝ වෙනයම් කවර වූ හෝ හේතුවක් සම්බන්ධයෙන් සුරාබදු කොමසාරිස්ගෙන් හෝ ශ්‍රී ලංකා ආණ්ඩුවෙන් කිසිදු හිමිකම් පෑමක් කිරීමට බලපත්‍රධාරියා/ධාරින්ට අයිතියක් නොතිබිය යුතුය.

18. කලින් අවලංගු කරනු ලැබුවහොත් මිස මේ බලපත්‍රය .................. වන දින සිට 19 ......... ක්වූ ..................... මස 31 වන දින තෙක් වළංගුව පවත්නේය.

අත්සන : ..................................

සාක්ෂි : ..................................

වර්ෂ 19 ......... ක්වූ ........................ මස ............ වන දින,
කොළඹ, සුරාබදු කොමසාරිස් කාර්යාලයේ දීය.

ගාස්තුව රු:..................

සුරාබදු ඒ. (එ්.ජ්. ඇල්.)3

(පිටත ගෙන ගොස් පරිභෝජනය කිරීම සඳහා) රට බීම සිල්ලරට විකිණීම සඳහා බලපත්‍ර ලත් ස්ථානවල (ඒ ස්ථානවලදී පරිභෝජනය පිණිස නොව) බෝතල ගණනේ පමණක් අරක්කු විකිණීම සඳහා දෙන බලපත්‍රය.

තත් කාලයේ වළංගු සියළුම සුරාබදු බලපත්‍ර වලට ආදළ පොදු කොන්දේසි මාලාවටද මේ බලපත්‍රයට අදළ පහත සඳහන් විශේෂ කොන්දේසිවලටද යටත්ව (මෙහි මින් මතු බලපත්‍රධාරියා/ධාරීන් යයි කියනු ලබන) ............................................................................................ පදිංචි ..............................................................ට (මෙහි මින් මතු බලපත්‍රය ලත් ස්ථානයයි කියනු ලබන) ........................................................................ දිස්ත්‍රික්කයේ ................................................................ වීථියේ අංක ........................ දරණ ස්ථානයේ පිහිටියා වූ ද ...................................................... යනුවෙන් ව්‍යවහාර කරනු ලබන්නා වූ ද ස්ථානයෙහි සීල් බෝතල් ගණනේ පමණක් අරක්කු විකිණීමට මෙයින් බලය දෙනු ලැබේ.

විශේෂ කොන්දේසි

1. සීල් බෝතල්වල පමණක් සහ .................................................................. දිස්ත්‍රික්කයේ ....................................... හි පිහිටි අංක ............................ දරණ තැබෑරුමෙන් පමණක්, එකී තැබෑරුමෙහි (මෙහි මින්මතු "රේන්දකරු" යනුවෙන් හඳුන්වනු ලබන) රේන්දකරුට මහජනයා වෙත සීල් බෝතල් අරක්කු විකිණීමට නීතියෙන් බලය ලැබී ඇති මිලට බලපත්‍රධාරියා/ධාරීන් විසින් අරක්කු ලබා ගත යුතුය. කෙසේ වෙතත් නිසි පරිදි, අනුමත කරනු ලැබූ ස්ථානයක, "පදම් කළ අරක්කු" "ඉක්ෂුපාක අරක්කු" හෝ "උක් අරක්කු" හෝ නිපදවීමට බලපත්‍රයක් නිකුත් කරනු ලැබූ තැනැත්තෙකුගෙන්, සුරාබදු අධිකාරී විසින් නිකුත් කරනු ලැබූ අවසර පත්‍රයක් මත "පදම් කළ අරක්කු" "ඉක්ෂුපා අරක්කු" හෝ "උක් අරක්කු" හෝ සීල් බෝතල් වලින් ලබාගැනීමට ද හැකිය.

2. (අ) සුරාබදු අධිකාරී විසින් නිකුත් කරනු ලබන අවසර පත්‍රයක බලය පිට මිස, එකී තැබෑරුමේ සිට බලපත්‍ර ලත් ස්ථානයට සීල් බෝතල් අරක්කු කිසිත් ගෙන නොයා යුතුය. එය නිකුත් කරනු ලබන දිනයේ ප. ව. 6ට පසු කවර වේලාවකදීවත් කිසිම අවසර පත්‍රයක් පාවිච්චි කිරීමට ඉඩ දෙනු නො ලැබේ.

(ආ) එවැනි සියලුම අවසර පත්‍ර බලපත්‍ර ලත් ස්ථානයෙහි ලිපි ගොණුවක යොද ඒ අවසර පත්‍රය නිකුත් කරනු ලැබූ දිනයේ පටන් දෙළොස් මාසයක් ගතවනු තුරු පරීක්ෂා කිරීම සඳහා ඉදිරිපත් කළ හැකිවන අයුරු තබාගත යුතුය.

3. අරක්කු විකිණීම සීල් බෝතල් ගණනේ පමණක් විය යුතු අතර ස්ථානයෙන් පිටතට ගෙන ගොස් පරිභෝජනය කිරීම සඳහා විය යුතුය. ඒ ස්ථානයේදී සීල් අරක්කු බෝතල ඇරීම ද වීදුරු ගණනේ විකිණීම ද තහනම් ය.

4. වළංගු අවසර පත්‍රයක් නොමැතිව කිසියම් පුද්ගලයෙකුට එක් වරකට ඉම්පීරියල් ගැලුමකින් තුනෙන් එක් කොටසකට වැඩි වූ අරක්කු ප්‍රමාණයක් ඇතුළත් සීල් බෝතල් විකිණීම හෝ බලපත්‍ර ස්ථානයෙන් පිටතට ගෙන යෑමට ඉඩදීම හෝ බලපත්‍රධාරියා/ධාරීන් විසින් නො කළ යුතුය. සුරාබදු බලපත්‍ර සියල්ලම සම්බන්ධයෙන් අදළ පොදු කොන්දේසි මාලාවේ 14 වන කොන්දේසියේ මීට විරුද්ධව කුමක් සඳහන්ව තිබුණත්ද තමා මිළදී ගැනීමට බලාපොරොත්තු වන අරක්කු ගැලුම් ප්‍රමාණය වත්කර තිබෙන බෝතල් ගණන වෙනුවෙන් හිස් බෝතල් ගණනක් නොගෙනනු ලබන්නා වූ යම් කෙනෙකුට අරක්කු විකිණීම, තම අභිමතය පරිදි ප්‍රතික්ෂේප කිරීමට බලපත්‍රධාරියාට/ධාරීන්ට පුළුවන.

5. බලපත්‍ර ලත් ස්ථානයෙන් පිටතට ගෙන ගොස් පරිභෝජනය කිරීම සඳහා සීල් බෝතල් අරක්කු විකිණිය යුත්තේ බලපත්‍රධාරියා/ධාරීන් සතුව ඇති, (පිටත ගෙනගොස් පරිභෝජනය කිරීම සඳහා) රටබීම සිල්ලරට විකිණීමේ බලපත්‍රයෙන් රටබීම විකිණීමට අවසර දී ඇති වේලාවලට අදල පනවා ඇති සීමාවන්ට යටත්ව ය.

6. මේ බලපත්‍රය යටතේ විකුණනු ලබන්නාවූ හෝ විකිණීම පිණිස තබා ඇත්තාවූ හෝ සියළුම අරක්කු 1928 ජූලි මස 13 වන දින හා අංක 7,654 දරණ ගැසට් පත්‍රයේ පළවූ අංක 178 දරණ සුරාබදු නිවේදනයේ විධිවිධාන වලට අනුකූලව පරීක්ෂා කර බලන ලදුව, ඒ සඳහා තත් කාලයේ වළංගු අරක්කු රේන්ද විකිණීමේ කොන්දේසි මාලාව යටතේවූ නිවේදනය මගින් සුරාබදු කොමසාරිස් විසින් නියම කරන ලද සැර ප්‍රමාණයට අඩු නොවූ හෝ වැඩි නොවූ සැර ප්‍රමාණයක් ඇතුළත් අරක්කු විය යුතුය. ඒ අරක්කු වලට වතුර හෝ යම්කිසි පාටක් හෝ සුවඳක් හෝ රසක් හෝ ඇති කිරීම සඳහා එකතු කරන ද්‍රව්‍යයක් හෝ අන් කිසි ද්‍රව්‍යයක් හෝ එකතු නො කළ යුතුය.

7. 1 වැනි කොන්දේසියේ සඳහන් කරන ලද අරක්කු තැබෑරුමේ අරක්කු තොග අවසන් වූ අවස්ථාවල දී, හෝ සුරාබදු කොමසාරිස් විසින් බලපත්‍රය සඳහා යම්කිසි විශේෂ සලාක ප්‍රමාණයක් නියම කොට ඇති අවස්ථාවලදී හෝ මිස අනික් සෑම විටකදීම බලපත්‍රධාරියා/ධාරීන් විසින් සීල් බෝතල් වලින් අරක්කු ගැලුම් දෙකකට නො අඩු අරක්කු ප්‍රමාණයක් තමන් ළඟ තබාගත යුතුය.

8. කලින් කල සුරාබදු කොමසාරිස් විසින් අනුමත කර ඇති මිළ ගණන් වලට හැර අන් මිල ගණනකට සීල් බෝතල් අරක්කු නො විකිණිය යුතුය. කිසියම් අරක්කු වර්ගයක් විකුණනු ලබන විටක, බලපත්‍රධාරියා විසින් ඒ අරක්කු වෙනුවෙන් යම් සේවා ගාස්තුවක් හෝ කිසියම් අන්දමක අතිරේක ගාස්තුවක් අය නො කළ යුතුය.

9. මේ බලපත්‍රය යටතේ විකුණනු ලබන සීල් බෝතල් අරක්කු බලපත්‍ර ලත් ස්ථානයේ දී ම පරිභෝජනය කිරීම සඳහා නො විකිණිය යුතුය.

10. බලපත්‍රධාරියා/ධාරීන් විසින් මිලට ගන්නා වූ ද විකුණනු ලබන්නා වූ ද සියලුම අරක්කු පිළිබඳ ගිණුමක් මෙහි පහත සඳහන් ආකෘති පත්‍රයෙහි ප්‍රකාරයට ලියා තබා ගත යුතුයි. තමන් ළඟ ගබඩා කර තිබෙන එක් එක් අරක්කු වර්ගය පිළිබඳ ව ලේඛනයෙහි පිටු වෙන් වශයෙන් තබා ගත යුතුයි.

බෝතල් අරක්කු ලේඛණය (ගැලුම්වලින් හා ඩ්‍රෑම්වලින්)

වර්ගය :..............................

| 1 | 2 | 3 | | 4 | | 5 | | 6 | | 7 | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| මාසය | අවසර පත්‍ර අංකය | අතේ ඉතිරි ප්‍රමාණය | | ලැබී ඇත | | මුළු ගණන | | විකුණා ඇත | | ඉතිරි ප්‍රමාණය | |
| | | සම්. කා. | සම්. ප. | සම්. කා. | සම්. ප. | සම්. කා. | සම්. ප. | ස කා. | ස ප. | ස කා. | ස ප. |
| දින<br>1 සිට 31 වන දින තෙක් | | | | | | | | | | | |

11. නිෂ්පාදකයාගේ ලේබල් සහ ශීර්ෂ කෝෂ හෝ මුද්‍රාව නො කැඩූ සීල් බෝතල් අරක්කු හැර වෙන අරක්කු කිසිවක්වත් අරක්කු බෝතල සඳහා පාවිච්චි කෙරෙන වර්ගයේ ශීර්ෂ කෝෂ හෝ මුද්‍රාවක්වත් නිෂ්පාදකයා ගේ මුද්‍රාවට සමාන මුද්‍රාවක් තැබිය හැකි කිසිම උපකරණයක් වත් බල්පත්‍ර ලත් ස්ථානයෙහි හෝ ඊට අයත් යම්කිසි බිම් ගෙයක හෝ ඊට සම්බන්ධ අන්කිසි ගොඩනැගිල්ලක හෝ තබා නොගත යුතුය.

12. ඉහත 1 වැනි කොන්දේසියේ සඳහන් අරක්කු තැබෑරුමෙන් ඉවත්ව යන රේන්දකරුගෙන් නුවමනා ප්‍රමාණයේ විශාල අරක්කු තොගයක් තමන් විසින් මිලට ගනු ලැබීම සිදු නො වනු වස්, මේ බලපත්‍රය අවසන් වන අවුරුද්දේ ඔක්තෝබර් මස 15 වන දින සිට දෙසැම්බර් මස 15 වන දින දක්වා වූ කාල පරිච්ඡේදය තුළ අලෙවි වූ අරක්කු ප්‍රමාණය පදනම් කොට ගෙන දින දහයක සාමාන්‍ය අලෙවි ප්‍රමාණයකට වැඩි වන අරක්කු තොගයක් එම අවුරුද්දේ දෙසැම්බර් මස 31 වන දින වන විට තමා ළඟ තබා නො ගැනීමට බලපත්‍රධාරියා/ධාරීන් වග බලා ගත යුතුය.

13. පරීක්ෂක ශ්‍රේණියට අඩු නොවූ තත්ත්වයක් උසුලන සුරාබදු නිලධාරීන්ට සීල් බෝතල් අරක්කු විකිණීම සඳහා ස්ථානය හැර තිබෙන සියළුම වේලාවලදීම ඒ අරක්කු වල සැර ප්‍රමාණය ද තොග ගණන් මෙන් ගණන් හිලව් ද පරීක්ෂා කිරීමට අවකාශ දිය යුතුය.

14. මේ බලපත්‍රය සම්බන්ධයෙන්, ස්වකීය කළමනාකාරවරුන්, නියෝජිතයින් හා සේවකයින් කරන සියළුම ක්‍රියාවන් ගැන බලපත්‍රධාරියා/ධාරීන් වග කිව යුතුය.

15. පළමුකොට සුරාබදු කොමසාරිස් ගේ ලියවිල්ලකින් වූ අනුමතය ලබා ගෙන මිස, මේ බලපත්‍රය අන් කිසිවකුට පැවරීම තහනම්ය.

16. මේ බලපත්‍රය ඉල්ලා එවූ අයදුම්පත සමඟ බලපත්‍රධාරියා/ධාරීන් විසින් තැන්පත් කරන ලද රුපියල් 1000 ක මුදල මේ බලපත්‍රයේ සාමාන්‍ය සහ විශේෂ කොන්දේසි යථා පරිදි ඉටු කරනු ලබන බවට ඇපයක් වශයෙන් සුරාබදු කොමසාරිස් විසින් තබා ගනු ලබන අතර, මේ කොන්දේසිවලින් යමක් කඩ කිරීම සම්බන්ධයෙන් එකී සම්පූර්ණ මුදල හෝ එහි යම් කොටසක්, මේ කොන්දේසි කඩ කිරීම සම්බන්ධයෙන් ආඥාපනතේ සලස්වා ඇති දණ්ඩන නියමයන් පැනවීමට අමතරව සුරාබදු කොමසාරිස්ගේ පරම අභිමතය පරිදි රාජ්‍ය සන්තක කරනු ලැබීමට ද යටත් වන්නේය.

17. තම අරක්කු තොගය සම්පූර්ණයෙන්ම හෝ කොටසක් තමන් වෙත සපයනු ලැබීමට අපොහොසත් වීම සම්බන්ධයෙන් හෝ රේන්දකාරයා විසින් කරන ලද යම්කිසි ක්‍රියාවක් හෝ පැහැර හැරීමක් නිසා සිදුවන යම්කිසි පාඩුවක් හෝ අලාභයක් සම්බන්ධයෙන් හෝ වෙන යම් කවර වූ හෝ හේතුවක් සම්බන්ධයෙන් සුරාබදු කොමසාරිස්ගෙන් හෝ ශ්‍රී ලංකා ආණ්ඩුවෙන් කිසිදු හිමිකම් පෑමක් කිරීමට බලපත්‍රධාරියා/ධාරීන්ට අයිතියක් නොතිබිය යුතුය.

18. කලින් අවලංගු කරනු ලැබුවහොත් මිස මේ බලපත්‍රය ...................... වන දින පටන් 19......................ක්වූ ...................... මස 31 වන දින තෙක් වළංගුව පවත්නේය.

..........................................
සුරාබදු කොමසාරිස්,

වර්ෂ 19..................ක්වූ ................. මස ................. වන දින,
කොළඹ, සුරාබදු කොමසාරිස් කාර්යාලයේ දී ය.

1-173/1

---

එල්.ඩී.—බී. 10/73.

සුරා බදු ආඥා පනත

අංක 632 දරන සුරා බදු නිවේදනය

(අරක්කු තැබෑරුම් බලපත්‍රය)

1977 ජනවාරි මස 01 වන දින හා ඉන් පසුව—

(අ) තැබෑරුමක සිල්ලරට අරක්කු විකිණීම සඳහා වූ බලපත්‍ර වෙනුවෙන් බලපත්‍ර ගාස්තුවක් අය නොකළ යුතු යයි ද ;

(ආ) එකී බලපත්‍රවල ආකෘතිය හා කොන්දේසි මෙහි උපලේඛනයේ දක්වා ඇති ආකෘතිය හා කොන්දේසි විය යුතු යයි ද ;

(ඇ) 1969 ජූනි මස 06 වන දින අංක 14,857 දරන ගැසට් පත්‍රයේ පළ වූ අංක 576 දරන සුරා බදු නිවේදනය පරිච්ඡින්න විය යුතු යයි ද ;

(52 වන අධිකාරය වූ) සුරා බදු ආඥාපනතේ 25 වන වගන්තිය යටතේ මුදල් අමාත්‍යවරයා විසින් විධාන කර ඇත.

හේ. බ. විජේකෝන්,
සුරාබදු කොමසාරිස්,

1976 දෙසැම්බර් මස 31 වන දින,
කොළඹ දීය.

උපලේඛනය

අනුක්‍රමික අංකය සහ යන්ත්‍ර අංකය :.................

සුරා බදු සී. එස්. 5.
විවෘත කරන වේලාව :
වසන වේලාව :

සිල්ලරට අරක්කු විකිණීම සඳහා තැබෑරුම් බලපත්‍රය

.........................................................................පදිංචි................................................................................ට

19 දෙසැම්බර් මස 31 වන දිනයෙන් අවසන් වන නිල වර්ෂය තුළ, මෙහි පහත වඩාත් සම්පූර්ණ ලෙස විස්තර කර ඇති ස්ථානයෙහි සිල්ලරට අරක්කු විකිණීම සඳහා—

(අ) සියලුම සුරාබදු බලපත්‍රවලට අදාළ ව තත් කාලයෙහි වලංගුව බලපවත්නා පොදු කොන්දේසිවලට ;

(ආ) එකී ස්ථානයෙහි සිල්ලරට අරක්කු විකිණීම සඳහා තනි අයිතිය පවරා දෙනු ලැබුවේ යම් අරක්කු රේන්ද විකිණීම පිළිබඳ කොන්දේසි යටතේ ද ඒ කොන්දේසි වන්නාවූ ද පිළිපදිනු ලබන කොන්දේසි බවට බලපත්‍ර ලාභියා/බලපත්‍ර ලාභීන් ගිවිසුමකින් බැඳුණාවූ ද, කොන්දේසි වලට සහ ;

(ඇ) මේ බලපත්‍රයට අදළ පහත දක්වෙන විශේෂ කොන්දේසිවලට යටත්ව සුරා බදු ආඥාපනතේ විධි විධාන යටතේ මෙයින් බලය දෙනු ලැබේ.

1. **විකිණීම සහ තොග.**—(1) මෙහි මින් පසු විධි විධාන සලසා ඇතොත් මිස, මුදල් දී ඉල්ලූ විට, බලපත්‍රධාරියා/බලපත්‍රධාරීන් විසින්, සිල්ලරට අරක්කු විකිණීමේ තනි අයිතිය ආරම්භ වන දිනයේ පටන් මෙම බලපත්‍රය අහෝසි වන දිනය දක්වා, එක් එක් දිනයේ දී විවෘත කළ වේලාවේ සිට වසන වේලාව දක්වා—

(අ) අරක්කු සීල් බෝතල් වශයෙන්, සහ

(ආ) බලපත්‍ර ලත් ස්ථානයේදීම පරිභෝග කිරීම සඳහා පමණක් වීදුරු ප්‍රමාණයෙන් රාජ්‍ය ඉස්කාගාර සංස්ථාව විසින් තත් කාලයෙහි සපයනු ලබන අඩුම මිළ ඇති වර්ගයෙන් පමණක් අරක්කු ද විකිණිය යුතුය; නැතහොත් තත් කාලයේ දී රාජ්‍ය ඉස්කාගාර සංස්ථාව එම අඩුම මිළ ඇති අරක්කු වර්ගය නිකුත් නොකිරීම හේතු කොට ගෙන තැබෑරුමේ එම අරක්කු වර්ගය නොමැති නම් බලපත්‍රධාරියා/බලපත්‍රධාරීන් විසින් තැබෑරුමේ ඇති ඊළඟට මිළ අඩු අරක්කු වර්ගය, වීදුරු ප්‍රමාණයෙන් විකිණිය යුතුය.

එසේ වුවද—

(i) කිසියම් දිනක අරක්කු විකිණීම තහනම් කිරීමට සුරාබදු කොමසාරිස්ට බලය ඇත්තේය ; තවද

(ii) වරප්‍රසාදය බල පවත්නා කාල පරිච්ඡේදය තුළ යම් විටක, රාජ්‍ය ඉස්කාගාර සංස්ථාව විසින් අරක්කු සහිත බෝතල නිකුත් කිරීමට පෙර, එම සංස්ථාව විසින් අරක්කු බහා නිකුත් කරනු ලබන බෝතල වෙනුවට හිස් බෝතල සැපයිය යුතු යයි රාජ්‍ය ඉස්කාගාර සංස්ථාව ප්‍රකාශයක් කරන අවස්ථාවක, සියලු සුරාබදු බලපත්‍ර කෙරෙහි බලපවත්වන පොදු කොන්දේසි මාලාවේ අංක 14 දරන පොදු කොන්දේසියේ පටහැනිව කුමක් සඳහන් වුවද, තමා විසින් ගෙන යෑමට බලාපොරොත්තු වන අරක්කු බෝතල හා සමාන වර්ගයේ වූද සමාන ධාරිතාව ඇත්තා වූද හොඳ තත්වයේ සමාන හිස් බෝතල සංඛ්‍යාවක් ඉදිරිපත් නොකරන යම් ගැණුම්කරුවකු විසින් මුදල් ඉදිරිපත් කර තිබියදි වුවද, එම ගැණුම්කරු හට තැබෑරුමෙන් පිටත ගෙන යෑම සඳහා සීල් බෝතල අරක්කු විකිණීම බලපත්‍රධාරියා/බලපත්‍රධාරීන් විසින් ප්‍රතික්ෂේප කළ හැකිය.

7. (අ) බොන භාජන නිර්විද පෙනෙන්නාවූද ලකුණු කළාවූද ඒ ා වියයුතු බව—තැබෑරුමක පාවිච්චි කරන සෑම බොන භාජනයක්ම වීදුරුවලින් හෝ වෙනයම් විනිවිද පෙනෙන සුළු ද්‍රව්‍යයකින් තනා තිබිය යුතුය. එම භාජනයෙහි අඩංගු විය යුතු අරක්කු ප්‍රමාණය, එම භාජනයේ පරිධිය වටේ යටත් පිරිසෙයින් අඟල් දෙකක් දිගටද එම භාජනයේ ඉහළ සිට අඟල් බාගයකට නොඅඩුවද කැපූ රක්ත වර්ණ තිරස් රේඛාවකින් පෙන්නුම් කළ යුතුය. අරක්කු ප්‍රමාණයත් එම ප්‍රමාණය සඳහා අනුමත කළ, පවත්නා මිළ ගණනක් වීදුරුවේ හෝ වෙනයම් විනිවිද පෙනෙන භාජනයේ රතු පාටින් පැහැදිලිව සඳහන් කර තිබිය යුතු අතර, මිළ ගණන රක්ත වර්ණ ඉරෙහි මධ්‍ය ලක්ෂ්‍යයට ඉහලින් ද අරක්කු ප්‍රමාණය ඊට විරුද්ධ පැත්තේ, එනම්, භාජනයේ මිළ ගණන සටහන් කොට ඇති පැත්තට දුරස්ථම පිට පැත්තේ ද ලකුණු කළ යුතුය. එවකට පවත්නා මිළ ගණන් ලකුණු කරන ලද, අරක්කු ඩ්‍රැම් 1/4, ඩ්‍රැම් 1/2, ඩ්‍රැම් 3/4, ඩ්‍රැම් 1 සහ ඩ්‍රැම් 2 ප්‍රමාණයන් වෙනුවෙන් යටත් පිරිසෙයින් බොන භාජන 2 බැගින් පැවැත්විය යුතුය.

(ආ) මෙහි ඉහත නියම කර ඇති පරිදි ලකුණු කරන ලද බොන භාජනය තිරස් රේඛාව දක්වා පුරවා විනා බලපත්‍ර ලත් ස්ථානයේදී බීම සඳහා අරක්කු නොදිය යුතුය.

(ඇ) මෙහි ඉහත නියම කර ඇති බොන භාජන හැර වෙනත් බොන භාජන තැබෑරුමක තබා නොගත යුතුය.

8. සුරාබදු නිළධාරීන් විසින් පරීක්ෂා කිරීම.—විකිණීම පිණිස තැබෑරුමක තිබෙන හෝ ප්‍රදර්ශනය කර ඇති අරක්කු සියල්ල සෑම අවස්ථාවකදීම සෝදිසි කිරීමට සහ පරීක්ෂා කිරීමට යථා පරිදි බලය පවරනු ලැබ සිටින සුරා බදු නිලධාරීන් විසින් සෝදිසි කිරීමට හා පරීක්ෂා කිරීමට පුළුවන්කම ඇති කර තිබිය යුතුය.

9. අරක්කු ගණන් තැබීම.—(අ) බලපත්‍රධාරියා/බලපත්‍රධාරීන් විසින් ගුදමෙන් හෝ ඉක්ෂුපාක අරක්කු හෝ උක් අරක්කු හෝ පදමකළ අරක්කු නිෂ්පාදනය කිරීමට බලපත්‍ර ලත් ස්ථානයෙන් ලබාගත් සියලු අරක්කු ඔහු/ඔවුන් විසින් වෙනත් කිසිම ස්ථානයකට ගෙන නොගොස් කෙටිම මාර්ගයෙන් තැබෑරුමට ප්‍රවාහණය කොට නියමිත ආකෘතියෙහි වූ තැබෑරුම් ලේඛනයෙහි ගණන් ලියා තැබිය යුතුය. ඔහු/ඔවුන් විසින් විවිධ අරක්කු වර්ග සහ බෝතල ධාරිතාවන් වෙනුවෙන් සුරාබදු සි. එස්. 1 දරන ආකෘතියෙහි වෙනම ගණන් තැබිය යුතුය.

(ආ) සෑම තැබෑරුමකම අපතේ යෑමක් වේනම්, මුළු අපතය යෑම එක් එක් මාසය අවසානයේ දී පොතෙන් අස්කර, ඊළඟ මාසයේ පළමු වැනිදට එක් එක් වර්ගයේ අරක්කුවලින් නියම අතේ ඉතුරුව ඉදිරියට ගෙන යා යුතුය.

(ඇ) සිල්ලරට විකිණීමේ සීමාව ඉක්මවා, සුරාබදු සිඑස්ටී 1 ආකෘතියෙහි වූ අවසර පත්‍රවල බලය යටතේ කරනු ලබන සෑම විකිණීමක්ම සම්බන්ධයෙන් අවසර පත්‍රයේ අංකය, අවසර පත්‍ර දරන්නාගේ නම, නිකුත් කළ දිනය සහ වේලාව, අරක්කු වර්ග සහ බෝතලවල ධාරිතාව යටතේ නිකුත් කරන ලද ප්‍රමාණය, සහ අරක්කු නිකුත් කරන තැනැත්තාගේ අත්සන, යන කරුණු තත්කාලීනව සටහන් කරමින් ඔහු/ඔවුන් විසින් වෙනම ලේඛනයක් පැවැත්විය යුතුය.

(ඈ) බලපත්‍රධාරියා/බලපත්‍රධාරීන් ඔහුගේ/ඔවුන්ගේ තැබෑරුමෙහි සියලු ගිණුම් සිංහළ, දෙමළ හෝ ඉංග්‍රීසි යන භාෂාවකින් ලිවීමට සැළැස්විය යුතුය.

(ඉ) ඒ සියලු ගිණුම් තීන්තෙන් ලිවිය යුතුය.

(ඊ) පරීක්ෂණවලදී, විවෘත කළ හා විවෘත නොකළ බෝතල්වල විකුණනු ලැබූ අරක්කු ප්‍රමාණයන් ගණන් බැලීමට පරීක්ෂණ පවත්වන නිලධාරීන්ට හැකිවනු වස්, බලපත්‍රකරු/බලපත්‍රකරුවන් විසින් විවෘත බෝතලවලින් වීදුරු ගණනේ විකුණනු ලැබූ අරක්කු හා විවෘත නොකරන ලද බෝතල්වලින් විකුණනු ලැබූ අරක්කු විකිණීමෙන් ලබන මුදල්, වෙන වෙනම තබා ගත යුතුය.

10. වෙළඳාමෙන් ලැබුණු මුදල් ආදිය තැබෑරුමෙන් ඉවතට ගෙනයාම.—(1) බලපත්‍රධාරියා/බලපත්‍රධාරීන් විසින්, ඒ ඒ දවසේ අරක්කු වෙළඳාමෙන් ලැබුණු මුළු මුදල එදින තැබෑරුම වසන වේලාව සහ පසුදින පෙ.ව. 8.00 අතර කාලය තුළ තැබෑරුමෙන් ඉවතට ගෙන යාමට සැලැස්විය යුතුය. එහෙත් ඒ මුදල් ගෙනයාමට කලින් තැබෑරුමේ තබා ගැනීමට නියමිත පොත්පත්වල බලපත්‍රධාරියා/බලපත්‍රධාරීන් විසින් එදින ගණන් බලව සියල්ලම විධිවූ පරිදි සටහන් කරවීමට සැලැස්විය යුතුය. අරක්කු වීදුරු ගණනේ සහ සීල් බෝතල් ගණනේ විකුණා ලැබෙන මුදල්, එදින වෙළඳාමේ මුදල් තැබෑරුමෙන් ඉවත ගෙන යන තෙක්, වෙන වෙනම තැබිය යුතුය.

(2) අරක්කු විකිණීමෙන් ලැබුණු මුදල් හැර අන් කිසිම මුදලක් තැබෑරුමේ තැබීමට ඔහු/ඔවුන් විසින් ඉඩ නොදිය යුතුය.

(3) යම් දිනක අරක්කු විකිණීමෙන් ලැබුණු මුදලින් යම් කිසි කොටසක් තැබෑරුමෙන් ඉවත ගෙන යාමට වුවහොත් එසේ ගෙන යනු ලබන මුදල නිවැරදිව අකුරෙන් සහ ඉලක්කම්වලින් දක්වෙන තමා/තමන් විසින්ම හෝ බලය ලත් සේවකයෙකු විසින් හෝ විධිවූ පරිදි ලියා අත්සන්කර දින දමූ සටහනක් තැබෑරුමෙහි අමුණා නොතබා ඔහු/ඔවුන් විසින් එදිනෙද අරක්කු විකිණීමෙන් ලැබෙන මුදලින් කිසිම කොටසක් තැබෑරුම වසන වේලාවට කලින් තැබෑරුමෙන් ඉවතට ගෙන යාමට අවසර නොදිය යුතුය.

(4) යථා පරිදි බලයලත් සුරා බදු නිලධාරියෙකු විසින් ඉල්ලා සිටි විටකදී පූර්වෝක්ත සටහන පරීක්ෂණය සඳහා ඉදිරිපත් කළ යුතුවාක් මෙන්ම, ඒ සටහනෙහි යොදන ලද දින සිට එක් මසක කාල පරිච්ඡේදයක් තුළ ඒ සටහන තැබෑරුමෙහි තබාගත යුතුය.

11. බලපත්‍රධාරියා/බලපත්‍රධාරීන් විසින් තම තැබෑරුම පෙරවරු .........ට විවෘත කිරීමටද, පස්වරු............ට වැසීමටද සැලැස්විය යුතුය. තවද, තැබෑරුම වැසූ වේලාවේ සිට පසුදින විවෘත කරන වේලාව දක්වා වූ කාලය අතරතුරදී අරක්කු කිසිත් නොවිකිනිය යුතුය.

12. 19.........19............වර්ෂය හෝ ඊට පසු කාල පරිච්ඡේදයන් සඳහා වූ අරක්කු රේන්ද විකිණීමේ කොන්දේසිවල 6 (1) වන හෝ 6 (2) වන විශේෂ කොන්දේසියේ විධිවිධාන යටතේ බලපත්‍රධාරියා/බලපත්‍රධාරීන් ටෙන්ඩර් ඉදිරිපත් කිරීමට සුදුසුකම් ලබා නොතිබුණි නම්, දිසාපති විසින් බලපත්‍රය අවලංගු කරනු ලැබිය හැකි වන්නේය.

..............................................
දිසාපති.

19..........................මස.........වන දින,
..............................................කච්චේරියේ දීය.

අනුපරණ ගිවිසුම

අනුක්‍රමික අංකය හා යන්ත්‍රයෙහි අංකය : 632.

සිල්ලරට අරක්කු විකිණීම සඳහා වූ තැබෑරුම් බලපත්‍රය

බලපත්‍රධාරියාගේ නම :————.

බලපත්‍ර ලත් ස්ථානයේ විස්තර :————.

නිකුත් කළ දිනය :————.

වලංගු කාලය අවසන් වන දිනය :————.

ශත 50 හේ මුද්දරය :————.

..............................................කච්චේරිය

..............................................දිසාපති

19.............. දෙසැම්බර් මස 31 වන දිනෙන් අවසන් වන නිල වර්ෂය තුළ ඉහතින් වඩාත් සම්පූර්ණ ලෙස විස්තර කර ඇති ස්ථානයෙහි සිල්ලරට අරක්කු විකිණීම සඳහා වූ (මෙය උප පත්‍රිකාවක් වන) බලපත්‍රයෙහි සඳහන් නියමයන් හා කොන්දේසි බලපත්‍රධාරියා/බලපත්‍රධාරීන් වන .................................................... නැමැති මා / අප විසින් පිළිපැදිය යුතු පහත සඳහන් කොන්දේසිවලට යටත්ව මනා ලෙස හා අවංක ලෙස ඒවා පිළිපදින බවටද, ඉෂ්ඨ කරන බවටද, එකී බලපත්‍රධාරියා/බලපත්‍රධාරීන් වන මම / අපි දිසාපති සමඟ මෙයින් පොරොන්දු වෙමි/මු. එනම් :—

(අ) සියලුම සුරාබදු බලපත්‍රවලට අදාළව තත්කාලයෙහි වලංගුව බලපවත්නා පොදු කොන්දේසි ;

(ආ) තැබෑරුම් ඇතුළත නියමිත භාණ්ඩ හැර අන් කිසිවක් තබා ගැනීම තහනම් බව—මෙහි (ඇ) උප වගන්තියේ විධිවිධාන අනුව ද පරීක්ෂකයෙකුගේ තත්ත්වයට නොඅඩු සුරාබදු නිලධාරියකුගේ ලි..ත අවසරය සහිතවද විනා—

(i) බොන භාජන.

(ii) මේස දෙකක්.

(iii) පුටු දෙකක්

(iv) අනුමත කළ ගිණුම් පොත්, පරීක්ෂණ සටහන් පොත්, පෑන්, තීන්ත සහ ලිපි ද්‍රව්‍ය.

(V) මුදල් සහ ඒවා සුරක්ෂිතව තබා ගැනීමට භාජන.

(Vi) බලපත්‍රයද, සියලු සුරාබදු බලපත්‍ර සම්බන්ධයෙන් අදාල පොදු කොන්දේසිද, සුරාබදු කොමසාරිස්ට අවශ්‍ය වන වෙනයම් දැන්වීම්ද, ප්‍රදර්ශනය කිරීම සඳහා රාමු හෝ දැන්වීම් පුවරු.

(vii විෂබීජ නාශක ද්‍රව්‍ය තැබීමට භාජනයක්.

(Viii) බලයලත් එක් එක් සේවකයා සඳහා බංකුව බැගින් සහ,

(iX) 25 (4) වන පොදු කොන්දේසියෙන් නියමිත පරිදි පාවිච්චි කිරීම පිණිස පිරිසිදු ජලය සහ අපිරිසිදු ජලය සඳහා වෙනම භාජන, හැර අන් කිසි දෙයක් තැබෑරුම් ඇතුළතට ගෙන ඒමට බලපත්‍රධාරියා/බලපත්‍රධාරීන් විසින් කිසිවකුට අවසර නොදිය යුතුය.

(ඇ) තැබෑරුම්වලට පඩික්කම් සැපයීම—බලපත්‍රධාරියා/බලපත්‍රධාරීන් විසින් ඔහුගේ/ඔවුන්ගේ තැබෑරුමෙහි මනා ලෙස පිරිසිදු කළා වූද සෞඛ්‍යාරක්ෂකතත්ත්වයෙහි පවත්නා වූද පඩික්කම් යටත් පිරිසෙයින් තුනක් තබා ගත යුතු අතර, ඒවා විෂබීජ නාශක ද්‍රව්‍යයක් යොදා දිනපතා සේදිය යුතුය.

5. අවශ්‍ය වෙනොත් විශේෂ මිනුම් කරාම—ඕනෑම අවස්ථාවකදී සුරාබදු කොමසාරිස් විසින් අත්සන් කොට බලපත්‍රධාරියා/බලපත්‍රධාරීන් අමතා ලියවිල්ලකින් නියෝග කළහොත් ඔහු විසින් අනුමත කරනු ලබන මෝස්තරයක විශේෂ මිනුම් කරාම මගින් වීදුරු ගණනේ අරක්කු විකිණීම කළ යුතුය.

6. ප්‍රමිත මිනුම් තබා ගත යුතු බව—සුරාබදු කොමසාරිස් විසින් අනුමත කරනු ලැබූ ඩ්‍රෑම්1, සහ ඩ්‍රෑම්1/2 ප්‍රමාණයේ ප්‍රමිත් මිනුම් සෑම තැබෑරුමකම තබා ගත යුතු අතර, මේ ගැණුම් කරුවකු විසින් ඉල්ලා සිටි විටෙක ඔහු විසින් මිළට ගත් අරක්කු මැනීම පිණිස ඒවා පාවිච්චි කළ යුතුය.

7. (අ) බොන භාජන විනිවිද පෙනෙන්නාවූද, ලකුණු කළාවූ ද ඒවා විය යුතු බව—තැබෑරුමක් පාවිච්චි කරන සෑම බොන භාජනයක්ම වීදුරු වලින් හෝ වෙන යම් විනිවිද පෙනෙන ද්‍රව්‍යයකින් තනා තිබිය යුතුය. එම භාජනයෙහි අඩංගු විය යුතු අරක්කු ප්‍රමාණය එම භාජනයේ පරිධිය වටේ යටත් පිරිසෙයින් අඟල් දෙකක් දිගටද එම භාජනයේ ඉහළ සිට අඟල් බාගයකට නො අඩුවද කැපූ රක්ත වර්ණ තිරස් රේඛාවකින්පෙන්නුම් කළ යුතුය. අරක්කු ප්‍රමාණයත් එම ප්‍රමාණය සඳහා අනුමත කළ, පවත්නා මිළ ගණනත් වීදුරුවේ හෝ වෙනයම් විනිවිද පෙනෙන භාජනයේ රතු පාටින් පැහැදිලිව සඳහන් කර තිබිය යුතු අතර, මිළ ගණන රක්ත වර්ණ ඉරෙහි මධ්‍ය ලක්ෂ්‍යයට ඉහළින් ද අරක්කු ප්‍රමාණය ඊට විරුද්ධ පැත්තේ, එනම්, භාජනයේ මිළ ගණන සටහන් කොට ඇති පැත්තට දුරස්ථම පිට පැත්තේද ලකුණු කළ යුතුය. එවකට පවත්නා මිළ ගණන් ලකුණු කරන ලද, අරක්කු ඩ්‍රෑම් 1/4, ඩ්‍රෑම් 1/2, ඩ්‍රෑම් 3/4, ඩ්‍රෑම් 1 සහ ඩ්‍රෑම් 2 ප්‍රමාණයන් වෙනුවෙන් යටත් පිරිසෙයින් බොන භාජන 2 බැගින් පැවැත්විය යුතුය.

මෙහි ඉහත නියම කර ඇති පරිදි ලකුණු කරන ලද බොන භාජනය තිරස් රේඛාව දක්වා පුරවා විනා බලපත්‍ර ලත් ස්ථානයේදී බීම සඳහා අරක්කු නො දිය යුතුය.

(ආ) මෙහි ඉහත නියමු කර ඇති බොන භාජන හැර වෙනත් බොන භාජන තැබෑරුමක තබා නො ගත යුතුය.

8. සුරාබදු නිලධාරීන් විසින් පරීක්ෂා කිරීම—විකිණීම පිණිස තැබෑරුමක තිබෙන හෝ ප්‍රදර්ශනය කර ඇති අරක්කු සියල්ල සෑම අවස්ථා වකදීම සෝදිසි කිරීමට සහ පරීක්ෂා කිරීමට යථා පරිදි බලය පවරනු ලැබ සිටින සුරාබදු නිලධාරීන් විසින් සෝදිසි කිරීමට හා පරීක්ෂා කිරීමට පුළුවන්කම ඇති කර තිබිය යුතුය.

9. අරක්කු ගණන් තැබීම—(අ) බලපත්‍රධාරියා/බලපත්‍රධාරීන් විසින් ගුදමෙන් හෝ ඉක්ෂුපාක අරක්කු හෝ උක් අරක්කු හෝ පැඟි කළ අරක්කු නිෂ්පාදනය කිරීමට බලපත්‍ර ලත් ස්ථානයෙන් ලබාගත් සියලු අරක්කු ඔහු/ඔවුන් විසින් වෙනත් කිසිම ස්ථානයකට ගෙන නොගොස් කෙටිම මාර්ගයෙන් තැබෑරුමට ප්‍රවාහනය කොට නියමිත ආකෘතියෙහිවූ තැබෑරුම් ලේඛණයෙහි ගණන් ලියා තැබිය යුතුය. ඔහු/ඔවුන් විසින් විවිධ අරක්කු වර්ග සහ බෝතල් ධාරිතාවන් වෙනුවෙන් සුරාබදු සීඑස් 1 දරණ ආකෘතියෙහි වෙනම ගණන් තැබිය යුතුය.

(ආ) සෑම තැබෑරුමකම අපතේ යෑමක් වේ නම්, මුළු අපතය යෑම එක් එක් මාසය අවසානයේ දී පොතෙන් අස්කර ඊළඟ මාසයේ පළමු වනදට එක් එක් වර්ගයේ අරක්කුවලින් නියම අතේ ඉතුරුව ඉදිරියට ගෙන යා යුතුය.

(ඇ) සිල්ලරට විකිණීමේ සීමාව ඉක්මවා, සුරාබදු සීඑස්ටී 1 ආකෘතියෙහි වූ අවසර පත්‍රවල බලය යටතේ කරනු ලබන සෑම විකිණීමක්ම සම්බන්ධයෙන් අවසර පත්‍රයේ අංකය, අවසර පත්‍ර දරන්නාගේ නම, නිකුත් කළ දිනය සහ වේලාව, අරක්කු වර්ග සහ බෝතලවල ධාරිතාව යටතේ නිකුත් කරන ලද ප්‍රමාණය, සහ අරක්කු නිකුත් කරන තැනැත්තාගේ අත්සන, යන කරුණු තත් කාලීනව සටහන් කරමින් ඔහු/ඔවුන් විසින් වෙනම ලේඛනයක් පැවැත් විය යුතුය.

(ඈ) බලපත්‍රධාරියා/බලපත්‍රධාරීන් ඔහුගේ/ඔවුන්ගේ තැබෑරුමෙහි සියළු ගිණුම් සිංහල, දෙමළ හෝ ඉංග්‍රීසි යන භාෂාවකින් ලිවීමට සැලැස් විය යුතුය.

(ඉ) ඒ සියළු ගිණුම් තීන්තෙන් ලිවිය යුතුය.

(ඊ) පරීක්ෂණවලදී, විවෘත කළ හා විවෘත නොකළ බෝතල්වල විකුණනු ලැබූ අරක්කු ප්‍රමාණයන් ගණන් බැලීමට පරීක්ෂණ පවත්වන නිලධාරීන්ට හැකි වනු වස් බලපත්‍රකරු/බලපත්‍රකරුවන් විසින් විවෘත බෝතලවලින් වීදුරු ගණනේ විකුණනු ලැබූ අරක්කු හා විවෘත නො කරන ලද බෝතල් වලින් විකුණනු ලැබූ අරක්කු විකිණීමෙන් ලබන මුදල්, වෙන වෙනම තබාගත යුතුය.

10. වෙළඳාමෙන් ලැබුණු මුදල් ආදිය තැබෑරුමෙන් ඉවතට ගෙන යාම — (1) බලපත්‍රධාරියා/බලපත්‍රධාරීන් විසින්, ඒ ඒ දවසේ අරක්කු වෙළඳාමෙන් ලැබුණු මුළු මුදල එදින තැබෑරුම් වසන වේලාව සහ පසුදින පෙ. ව. 8.00 අතර කාලය තුළ තැබෑරුමෙන් ඉවතට ගෙනයාමට සැලැස්විය යුතුය. එහෙත් ඒ මුදල් ගෙනයාමට කලින් තැබෑරුමේ තබා ගැනීමට නියමිත වූ පොත් පත් වල බලපත්‍රධාරියා/බලපත්‍රධාරීන් විසින් එදින ගණන් තිලව සියල්ලම විධිවූ පරිදි සටහන් කරවීමට සැලැස්විය යුතුය. අරක්කු වීදුරු ගණනේ සහ සීල් බෝතල් ගණනේ විකුණා ලැබෙන මුදල් එදින වෙළඳාමේ මුදල් තැබෑරුමෙන් ඉවත ගෙන යන තෙක්, වෙන වෙනම තැබිය යුතුය.

(2) අරක්කු විකිණීමෙන් ලැබුණු මුදල් හැර අන් කිසිම මුදලක් තැබෑරුමේ තැබීමට ඔහු/ඔවුන් විසින් ඉඩ නොදිය යුතුය.

(3) යම් දිනක අරක්කු විකිණීමෙන් ලැබුණු මුදලින් යම්කිසි කොටසක් තැබෑරුමෙන් ඉවත ගෙන යාමට වුවහොත් එසේ ගෙන යනු ලබන මුදල නිවැරදිව අකුරෙන් සහ ඉලක්කම්වලින් දක්වෙන ඔහු/තමන් විසින්ම හෝ බලය ලත් සේවකයකු විසින් හෝ විධි වූ පරිදි ලියා අත්සන් කරු දින දමූ සටහනක් තැබෑරුමෙහි අමුණා නො තබා ඔහු/ඔවුන් විසින් එදින අරක්කු විකිණීමෙන් ලැබුණු මුදලින් කිසිම කොටසක් තැබෑරුම වසන වේලාවට කලින් තැබෑරුමෙන් ඉවතට ගෙන යෑමට අවසර නොදිය යුතුය.

(4) යථා පරිදි බලය ලත් යම් සුරාබදු නිලධාරියකු විසින් ඉල්ලා සිටි විටෙකදී පූර්වෝක්ත සටහන පරීක්ෂණය සඳහා ඉදිරිපත් කළ යුතුවාක් මෙන්ම, ඒ සටහනෙහි යොදන ලද දින සිට එක් මසක කාල පරිච්ඡෙදයක් තුළ ඒ සටහන තැබෑරුමෙහි තබාගත යුතුය.

11. බලපත්‍රධාරියා/බලපත්‍රධාරීන් විසින් තම තැබෑරුම පෙරවරු ....................ට විවෘත කිරීමටද, පස්වරු....................ට වැසීමටද සැලැස්විය යුතුය. තවද, තැබෑරුම වැසූ වේලාවේ සිට පසුදින විවෘත කරන වේලාව දක්වා වූ කාලය අතරතුරදී අරක්කු කිසිත් නොවිකිණිය යුතුය.

12. 19................19................. වර්ෂය හෝ ඊට පසු කාල පරිච්ඡේදයන් සඳහා වූ අරක්කු රේන්ද විකිණීමේ කොන්දේසිවල 6 (1) වන හෝ 6 (2) වන විශේෂ කොන්දේසියේ විධිවිධාන යටතේ බලපත්‍රධාරියා/බලපත්‍රධාරීන් ටෙන්ඩර් ඉදිරිපත් කිරීමට සුදුසුකම ලබා නො තිබුණි නම්, දිසාපති විසින් බලපත්‍රය අවලංගු කරනු ලැබිය හැකි වන්නේය.

.............................................
බලපත්‍රධාරියා.

19.......................මස..........................වන දින,

.....................................................කච්චේරියේ දී ය.

1-173/2

---

සු. කො. ගේ අංකය : 301/ඒ/115.

සුරාබදු ආඥාපනත

අංක 633 දරන සුරාබදු නිවේදනය

1963 පෙබරවාරි මස 22 වෙනි දින අංක 13,529 දරන ගැසට් පත්‍රයේ පළ කරන ලද අංක 509 දරන සුරාබදු නිවේදනයෙන් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර සුරාබදු කොමසාරිස්, හේරත් බණ්ඩා විජේකෝන් වන මම, 1977 ජනවාරි මස 01 දින සහ ඉන් පසුව—

(1) විදේශ මත්පැන් විකිණීම සඳහා බලපත්‍රලත් යම් ස්ථානයක අරක්කු විකිණිය යුතු මිළ ප්‍රමාණයන් විදේශීක මත්පැන් විකිණීමට අදාළවූ කිසියම් සුරාබදු නිවේදනයක අරක්කු විකිණීම සඳහා මීට පෙර නියම කරනු ලැබ තිබුණු මිළ ප්‍රමාණයන් වෙනුවට, මෙහි උපලේඛනයෙහි නියම කර ඇති මිළ ප්‍රමාණයන් විය යුතු බවත්,

(2) 1976 ජූලි මස 14 වැනි දින සහ අංක 221/7 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද අංක 629 දරන සුරාබදු නිවේදනය පරිච්ජින්න විය යුතු බවත් (52 වන අධිකාරයවූ) සුරාබදු ආඥාපනතේ 25 වන වගන්තිය යටතේ විධානය කරමි.

හේ. බ. විජේකෝන්,
සුරාබදු කොමසාරිස්.

1976 දෙසැම්බර් මස 31 වෙනි දින,
කොළඹ 1,
සුරාබදු කොමසාරිස් කාර්‍යාලයේ දීය.

උපලේඛනය

(1) (බලපත්‍රලත් ස්ථානයේ දී පරිභෝග කිරීමට නොව පිටතට ගෙන ගොස් පරිභෝග කිරීම පිණිස) රටබිම බෝතල වශයෙන් පමණක් සිල්ලරට විකිණීම සඳහා බලපත්‍රලත් ස්ථානවල, නොකැඩූ බෝතල් වශයෙන් පමණක් —

| වර්ගය | එක් බෝතලයක් | | |
|---|---|---|---|
| | පිළිගත් ක්වෝට් | පිළිගත් පයින්ට් | නිප් |
| | රු. ශ. | රු. ශ. | රු. ශ. |
| (අ) අවුරුදු දහයක් පරණ පොල් අරක්කු ... ... | 42 0 | — | — |
| (ආ) 'ඕල්ඩ් සීදුව' (දෙවරක් පෙරූ) අරක්කු ... ... | 34 0 | — | — |
| (ඇ) ඉතා විශේෂ පරණ අරක්කු ... ... ... | 28 0 | — | — |
| (ඈ) පොල් අරක්කු ... ... ... | 19 0 | 9 50 | 4 75 |
| (ඉ) විශේෂ අරක්කු ... ... ... | 15 50 | 7 75 | 3 90 |

(II) බලපත්‍රලත් ස්ථානයේදීම පරිභෝග කිරීම සඳහාය. රටබිම විකිණීමට බලපත්‍රලත් ස්ථානවල—

| වර්ගය | වීදුරු වශයෙන් | | නොකැඩූ බෝතල වශයෙන් | | |
|---|---|---|---|---|---|
| | ඩ්‍රෑම් 1 ක් | ඩ්‍රෑම් 1/2ක් | පිළිගත් ක්වෝට් 1ක් | පිළිගත් පයින්ට් 1ක් | නිප් 1 ක් |
| | රු. ශ. | රු. ශ. | රු. ශ. | රු. ශ. | රු. ශ. |
| (අ) අවුරුදු දහයක් පරණ පොල් අරක්කු ... | 8 0 | 4 0 | 64 0 | — | — |
| (ආ) 'ඕල්ඩ් සීදුව' (දෙවරක් පෙරූ) අරක්කු ... | 6 50 | 3 25 | 52 0 | — | — |
| (ඇ) ඉතා විශේෂ පරණ අරක්කු ... ... | 5 30 | 2 65 | 42 40 | — | — |
| (ඈ) පොල් අරක්කු ... ... ... | 2 40 | 1 20 | 20 0 | 10 0 | 5 0 |
| (ඉ) බෝතල් ගත විශේෂ අරක්කු ... ... | 2 0 | 1 0 | 17 0 | 8 50 | 4 25 |

1-173/3

1977 රේන්ද වර්ෂය හා ඊට පසු කාලපරිච්ඡේදය සඳහා වූ අරක්කු රේන්ද විකිණීමේ කොන්දේසි මාලාව

නිකුත් කරන අවස්ථාවේදී අරක්කුවල සැර ප්‍රමාණය

අංක 1 දරන නිවේදනය

(1) රාජ්‍ය ඉස්කාගාර සංස්ථාවේ ගුදමක මගින් නිකුත් කරනු ලබන අරක්කුවල සැර ප්‍රමාණ 1977 ජනවාරි මස 01 දින සිට, මෙහි පහත දක්වා ඇති උපලේඛනයෙහි දක්වා ඇති සැර ප්‍රමාණය විය යුතු යයිද,

(2) 1976 ජූලි මස 07 වෙනි දින අංක 220/12 දරනා ගැසට් පත්‍රයෙහි පළ කරන ලද අංක 5 දරන නිවේදනය මෙම නිවේදනය ගැසට් පත්‍රයෙහි පළවූ දින සිට පරිච් ්න්න විය යුතු යයි ද, 1976 නොවැම්බර් මස 05 වැනි දින හා අංක 237/6 දරන ගැසට් පත්‍රයේ පළ කරන ලද 1977 වර්ෂයට හා ඊට පසු කාලපරිච්ඡේදය සඳහාවූ අරක්කු රේන්ද විකිණීමේ කොන්දේසි මාලාවේ 18 වෙනි කොන්දේසිය යටතේ සුරා ද කොමසාරිස්, හේරත් බණ්ඩා විජේකෝන් වන මම මෙයින් නියෝග කරමි.

හේ. බ. විජේකෝන්,
සුරාබද්ද කොමසාරිස්.

1976 දෙසැම්බර් මස 31 වැනි දින,
කොළඹ 1,
සුරාබද්ද කොමසාරිස් කාර්‍යාලයේ දිය.
සු. කො. අංකය : 301/ජී/115.

උපලේඛනය

| අරක්කු වර්ගය | ලංඝ සම්මත සැර ප්‍රමාණය අංශක |
|---|---|
| (අ) විශේෂ අරක්කු | 40–42 |
| (ආ) පොල් අරක්කු | 40–42 |
| (ඇ) ඉතා විශේෂ පරණ අරක්කු | 34–46 |
| (ඈ) 'ඕල්ඩ් සිදුව' (දෙවරක් පෙරූ) අරක්කු | 27–29 |
| (ඉ) අවුරුදු දහයක් පරණ පොල් අරක්කු | 34–36 |

1–173/4

1977 රේන්ද වර්ෂය හා ඊට පසු කාලපරිච්ඡේදය සඳහා වූ රේන්ද විකිණීමේ කොන්දේසි

2 වෙනි නිවේදනය

වර්ෂ 1976 නොවැම්බර් මස 05 වෙනි දින අංක 237/6 දරන ගැසට් පත්‍රයේ පළ කරන ලද වර්ෂ 1977 හා ඊට පසු කාල පරිච්ඡේදය සඳහාවූ අරක්කු රේන්ද විකිණීමේ කොන්දේසි මාලාවේ 18 වෙනි කොන්දේසිය මගින් හා 1976 දෙසැම්බර් මස 31 වෙනි දින හා අංක 245/11 දරන ගැසට් පත්‍රයේ පළ කරන ලද අංක 632 දරන සුරාබද්ද නිවේදනයේ නියමාකාරයෙන් දක්වා ඇති අරක්කු තැබෑරුම් බලපත්‍රයේ 2(අ) දරන කොන්දේසියෙන් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර සුරාබද්ද කොමසාරිස්, හේරත් බණ්ඩා විජේකෝන් වන මම,

(1) කනි අයිතිය දනය කරනු ලැබූ තැනැත්තන් විසින් එකී අරක්කු මෙහි පහත උපලේඛනයෙහි දක්වා ඇති මිළ ගණන් අනුව 1977 ජනවාරි මස 01 දින සිට විකිණිය යුතු යැයි ද,

(2) 1976 ජූලි මස 14 වෙනි දින 221/7 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද අංක 7 දරන නිවේදනය 1977 ජනවාරි මස 01 වෙනි දින සිට පරිච්ඡින්න විය යුතු යැයි ද,

නිවේදනය කරමි.

හේ. බ. විජේකෝන්,
සුරාබද්ද කොමසාරිස්.

1976 දෙසැම්බර් මස 31 වෙනි දින,
කොළඹ 1,
සුරාබද්ද කොමසාරිස් කාර්යාලයේ දිය.

උපලේඛනය

(i) මුද්‍රා තැබූ බෝතල්වලට පුරවා—

| (1) වර්ගය | (2) බෝතල් වර්ගය | | | | | |
|---|---|---|---|---|---|---|
| | රෙපසුටඩ ක්වෝට් (ගැලුමට බෝතල් 6) | | රෙපසුටඩ පයින්ට් (ගැලුමට බෝතල් 12) | | නිප් (ගැලුමට බෝතල් 24) | |
| | බෝතලයක් රු. ශ. | ගැලුමක් රු. ශ. | බෝතලයක් රු. ශ. | ගැලුමක් රු. ශ. | බෝතලයක් රු. ශ. | ගැලුමක් රු. ශ. |
| (1) අවුරුදු දහයක් පරණ පොල් අරක්කු | 40 0 | 240 0 | — | — | — | — |
| (2) 'ඕල්ඩ් සිදුව' (දෙවරක් පෙරූ) අරක්කු | 33 0 | 198 0 | — | — | — | — |
| (3) ඉතා විශේෂ පරණ අරක්කු | 27 0 | 162 0 | — | — | — | — |
| (4) පොල් අරක්කු | 18 0 | 108 0 | 9 0 | 108 0 | 4 50 | 108 0 |
| (5) විශේෂ අරක්කු | 15 0 | 90 0 | 7 50 | 90 0 | 3 75 | 90 0 |

(ii) ඩ්‍රෑම් වශයෙන්

| (1) වර්ගය | (2) ඩ්‍රෑම් 1 ක් රු. ශ. | (3) ගැලුම් 1 ක් රු. ශ. |
|---|---|---|
| උපරිම— විශේෂ අරක්කු | 1 90 | 91 20 |
| පොල් අරක්කු | 2 30 | 110 40 |

1–173/5

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී